# බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාව
# මහා සභා රැස්වීමේ වාර්තාව.
# 2020.02.18

වර්ෂ 2020 ක් වූ පෙබරවාරි මස 18 වන අඟහරුවාදා දින පෙ.ව. 09.30 ට බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේ දී පැවැත්වූ පෙබරවාරි මස මහා සභා රැස්වීමේ වාර්තාවයි.

**සහභාගීත්වය.**

01. ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා
02. ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා
03. ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා
04. ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා
05. ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා
06. ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා
07. ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා
08. ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා
09. ගරු මන්ත්‍රිනි එම්. ගයාත්‍රි කාංචනා මැතිණිය
10. ගරු මන්ත්‍රිනි ඩී.ජී. වාසනා උදයංගනී මැතිණිය
11. ගරු මන්ත්‍රී යූ.එල්. තුසිත චාමින්ද මැතිතුමා
12. ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා
13. ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා
14. ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා
15. ගරු මන්ත්‍රී කේ.යූ.ජී. යසරත්න මැතිතුමා
16. ගරු මන්ත්‍රිනි ජී. ටෙක්ලා ශ්‍යාමලී මැතිණිය
17. ගරු මන්ත්‍රිනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය
18. ගරු මන්ත්‍රිනි ඒ.ආර්.එස්. සංජීවනී අතුකෝරල මැතිණිය
19. ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා
20. ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා
21. ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා

**නොපැමිණි**

01. ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා

මීට අමතරව ප්‍රාදේශීය සභාවේ ලේකම් එල්.එච්. අනිල් රංජන් මහතා ද සහභාගී විය.

**<u>ආගම සිහි කිරීම හා සභාව පිළිගැනීම.</u>**

ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සියලුම ගරු සභිකවරුන්, ලේකම්තුමා ප්‍රධාන නිලධාරීන් හා මාධ්‍යවේදීන් පිළිගැනීමෙන් අනතුරුව පළමුව ආගම සිහිපත් කරන ලදී. ඉන් අනතුරුව විනාඩියක නිශ්ශබ්දතාවය රැකීමෙන් රට වෙනුවෙන් සටන් වැද මියගිය රණවිරුවන් හා මියගිය සභිකවරුන්, නිලධාරීන් හා සේවකයන් සිහිපත් කරන ලදී.

(ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා සභාවට සහභාගිවීම සිදුවිය.)

**<u>(අ) පසුගිය රැස්වීමේ වාර්තාව සම්මත කිරීම</u>**

**<u>01) 2020-01-21 දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව සම්මත කිරීම</u>**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** 2020-01-21 දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව කියෙව්වා සේ සලකා, විරෝධතා හෝ නිවැරදි කිරීම් තිබේ නම් ඉදිරිපත් කරන්න. නැත්නම් 2020-01-21 දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව ලියා ඇති පරිදි ස්ථිර කරන ලෙස යෝජනා කරන්න. සංශෝධන තිබේ නම් ඉදිරිපත් කරන්න.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** 2020-01-21 දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව සංශෝධනවලට යටත්ව සභා සම්මත කිරීමට මම යෝජනා කරනවා.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** සංශෝධන තිබේ නම් ඉදිරිපත් කරන්න.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** 23 පිටුව

''මම සභාපතිතුමාටත් යොමු කරා ගල්කැටිය වත්ත මාර්ගයේ කාණු පද්ධතිය සකස් කරන්න කියලා.'' ඒක ''මම සභාපතිතුමාටත් යොමු කරා වැලිකැටිය වත්ත මාර්ගයේ කාණු පද්ධතිය සකස් කරන්න කියලා.'' ලෙස සංශෝධනය විය යුතුයි.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** 09 පිටුව

''හිටපු හැම කෙනෙකුම පරාද කරන්න වැඩ කරාට මට මිනිස්සු ඡන්දය දීලා මම මෙතනට ඇවිල්ලා තියෙනවා.'' ඒක ''හිටපු හැම සංවිධායක කෙනෙකුම පරාද කරන්න වැඩ කරාට මට මිනිස්සු ඡන්දය දීලා මම මෙතනට ඇවිල්ලා තියෙනවා.'' ලෙස සංශෝධනය විය යුතුයි.

10 පිටුව

''හැබැයි ප්‍රේමලාල් අබේසේකර නෑ.'' ඒක ''හැබැයි ප්‍රේමලාල් අබේසේකරගේ නමවත් නෑ.'' ලෙස සංශෝධනය විය යුතුයි.

42 පිටුව

ගරු සභාපතිතුමනි, මෙම කාරණය ආරවුලකට ගන්න එපා. අපි සභාව ගෙනියමු. නමුත් මම විසින් මේක දැක්විය යුතුයි. මේ සභාවේ 42 පිටුවේ තියෙනවා මුදල් හා ප්‍රතිපත්ති සැකසුම් කමිටු වාර්තාව සභා සම්මත කිරීම. මේක නීත්‍යානුකූලද, මේ කියන්නේ 2019.12.20 දින පවත්වපු එක. ඊට පස්සේ සභාවල් ගණනාවක් තිබිලා තියෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** 2019.12.20 ට පස්සේ පළවෙනි මාසේ මහා සභාව තියෙන්නේ. මේ දෙවැනි මාසයනේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඇයි ජනවාරි මාසයේ තියෙන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මේ ජනවාරි මාසයේ වාර්තාව තමයි.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** අයවැය සම්මත කිරීම, 2019.11.05 දින හා 2019.12.03 වාර්තාවක් දාලා තියෙනවා මේ සභාවේ සම්මත කරන්න. ඒක සම්මත කරපු එකක්. ඇත්තටම මට දැන් තේරෙන්නේ නෑ මේ තත්ත්වය මොකක්ද කියලා. මේකේ නීත්‍යානුකූලභාවය පිළිබඳ ඔබතුමා විස්තර ඇතිව දැන ගන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මට තේරුණේ නෑ කියපු එක.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** අයවැයක් සම්මත කිරීම ගැන තියෙනවා. ඒක ගැන දිගට ගෙනියන්න ඕන නැහැ. ඒක ගැන නීත්‍යානුකූල තත්ත්වය පිළිබඳව මේවා කරගන්න. ඒකේ සම්පූර්ණ වගකීම ඔබතුමාලා දරා ගන්න. මම දිගටම ඒ පිළිබඳව දැනුම් දීලා තියෙන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** තවත් සංශෝධන තියෙනවාද.

2020.01.21 දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව සංශෝධන වලට යටත්ව ඒකමතිකව සභා සම්මත විය.

(ගරු මන්ත්‍රී යූ.එල්. තුසිත චාමින්ද මැතිතුමා, ගරු මන්ත්‍රීනි ජී. ටෙක්ලා ශ්‍යාමලී මැතිණිය සභාවට සහභාගිවීම සිදුවිය.)

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** උප සභාපතිතුමා නිවසක් හදලා දුප්පත් පවුලකට භාර දීමේ ප්‍රජා සත්කාරක වැඩසටහනක අද දවසේ යෙදිලා ඉන්න නිසා එතුමාට නිවාඩු අනුමත කරන්න මම යෝජනා කරන්න.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** නිවාඩු කියලා කිවුවාද. මට නම් කිවුවා එනවා කියලා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** එතුමාට අයිතියක් තියෙනවා නිවාඩුවක් ගන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එතුමා ලිඛිත ඉල්ලීමක් එවලා තියෙනවා. මට කිවුවා එනවා කියලා. මම දැන් එනකොට කිවුවා එනවා කියලා. එහෙම නම් නිවාඩු අනුමත කරමු.

(ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා සභාවට සහභාගිවීම සිදුවිය.)

<u>**(ආ) සභාපතිවරයා විසින් කරනු ලබන විශේෂ නිවේදන ඃ-**</u> නැත.

<u>**(ඇ) ප්‍රාදේශීය සභාව අමතා එවන ලද සංදේශ, පෙත්සම්, පැමිණිලි හා සන්නිවේදන සභාව ඉදිරියේ තැබීම. ඃ-**</u>

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ- 01.** පරිසර බලපත්‍ර දීර්ඝ කිරීමේදී මතු වූ ගැටලු සම්බන්ධවයි. (ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා)

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, අවුරුදු 03 කට වරක් තමයි පරිසර බලපත්‍රයක් දෙන්නේ මම දන්න තරමට. ඒ පරිසර බලපත්‍රය ලබා දෙන අවස්ථාවේදී කලින් පරිසර බලපත්‍රය ගන්න කොට කොන්දේසියක් යොදලා තිබුණා පරිසර බලපත්‍රය ඉවර වෙන්න මාස තුනකට කලින් පරිසර බලපත්‍රය ලබා ගන්න නැවත ඉල්ලීමක් කරන්න කියලා. ඒ විදියට තමයි සාමාන්‍ය නීතිය තිබුණේ. පසුව මේ අවුරුද්දේ අපි පරිසර බලපත්‍රය ලබා ගන්න ගියාම ප්‍රශ්නයක් මතු වෙලා තියෙනවා. මාස 03 කට කලින් පරිසර බලපත්‍රය ලබා ගැනීමට ඉල්ලීම කරේ නැත්නම්, පරිසර බලපත්‍රය කල් ඉකුත් වුණා නම් මෙහෙට පරීක්ෂණ ගාස්තුවක් ගෙවන්න කියලා. ඒකේ වැරැද්දක් නෑ ගෙවන්න කිවුවට. ඒක රුපියල් තුන්දාහක්. එතකොට පරිසර බලපත්‍රය සමඟ මේකත් ආවම රුපියල් හත්දාහක් වෙනවා. එකපාර මේක දරා ගන්න බැරිවේවි ව්‍යාපාරිකයෙකුට. පරිසර බලපත්‍රය ලබා ගන්නේ ව්‍යාපාරිකයන්. ඒ සියලුදෙනා වෙනුවෙන් මේක බලපානවා. එතනදී මම මේ සභාවට දැනුම් දෙන්නේ, මේක මීට කලින් අපිව දැනුවත් කරන්න තිබුණා. අපේ ව්‍යාපාරිකයන්ට දැනුම් දෙන්න තිබුණා මොනයම් ක්‍රමයකින් හරි. පරිසර බලපත්‍රලාභීන් 20 ක් 25 ක් වගේ තමයි ඉන්නෙත්. ඒ කට්ටිය කැඳවලා හෝ ලිපියකින් හෝ දැනුම් දෙන්න තිබුණා නම් මෙන්න මෙහෙම ගැටළුවක් තියෙනවා කියලා. කලින් කල් පැනලා ගියත් ඉල්ලුවම දුන්නා. අලුතෙන් තමයි බලපත්‍රයක් ලබා ගන්න කොට මේක ගෙවන්න කියලා නිලධාරීන්ට යෝජනා වෙලා තියෙන්නේ. එතනදී මේ බලපත්‍රය ගන්න ගියාම පරිසර බලපත්‍රලාභීන්ට වෙනවා තව රුපියල් තුන්දහසක මුදලක් නැවත ගෙවන්න. ඒක අසාධාරණයක්. ඒක නිසා ඒ පරිසර බලපත්‍රලාභීන්ට ඒක දැනුම් දීලා, ඊට පස්සේ නැවත එහෙම නොකරත්, ඒ කාරණය ඉෂ්ඨ කරාට කමක් නෑ. එම නිසා මේ වතාවේ අපි ඉල්ලා සිටිනවා මේක මාස 06 කට හෝ දීර්ඝ කරලා නැවත යන විදියට මේ පරිසර බලපත්‍රය ලබා දෙන්න කියලා. මම ඒක යෝජනාවක් විදියට ගේනවා.

(ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා සභාවට සහභාගිවීම සිදුවිය.)

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මෙහෙමයි සුගත් මන්ත්‍රීතුමා. ඒක මාස තුනකට කලින් ඉල්ලන්න ඕන. ඒක හරි. ඔය ගාස්තුව අය කරන්නේ බලපත්‍රය කල්ඉකුත් වුණාම. කල්ඉකුත් වුණාම බිස්නස් එක කරලා තියෙනවානේ. ඒකට දඩයක් විදියට තමයි මේක ගන්නේ. වාහනයක වුණත් එහෙමයි. බලපත්‍රය කල්ඉකුත් වෙන දවසේ ඉඳන් දඩ මුදලක් අය කරනවා.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** සභාපතිතුමා ඔබතුමා නිලධාරීන්ගේ උපදෙස් අරගෙන කටයුතු කරන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** නිලධාරීන්ගේ නෙමෙයි අමාත්‍යාංශයෙන් ආපු චක්‍රලේඛයක්.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** කාගේ වුණත් ඒක වැරදි දෙයක්. ගෙන්වලා බලන්න ඒ චක්‍රලේඛය.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** පරිසර අමාත්‍යාංශයෙන් ආපු දෙයක්.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** අපිව දැනුවත් කරන්න එපැයි. අපි දන්නේ නෑ. මේක මේ සභාවක් විදියට නිලධාරීන් කියන දේම අපි පිළිගත්තොත් අපිට මේ සභාවෙන් වෙන අසාධාරණය වළක්වන්න බැහැ. සභාවෙන් සමස්ථයටම අසාධාරණයක් සිදු වෙනවා. ඒක අපි දකින හින්දා මේ කතා කරන්නේ. වෙන දෙයක් හින්දා නෙමෙයි. විෂය නිලධාරි ගෙන්වලා බලන්නකෝ ලිපි දෙකේ

තියෙන වෙනස. කලින් තිබුණ ලිපියේත්, මෙවර තියෙන ලිපියේත් වෙනස බලන්න. ඒකේ වෙනසක් තියෙනවා. හැම මන්ත්‍රී කෙනෙකුම දැන ගන්න ඕන මේකේ මොකක්ද වෙන්නේ කියලා. එහෙම නොදැන ගියාම ප්‍රශ්න තමයි. දැන් මම මේක අධ්‍යයනය කරපු නිසා තමයි මට මේ අවබෝධය ආවේ.

(ගරු මන්ත්‍රිනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය සභාවට සහභාගිවීම සිදුවිය.)

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමා ගෙවන්න ආවාද?.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** පැහැදිලිවම.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඕන නම් පරිසර කමිටුව කැඳවලා සාකච්ඡා කරමු. පරිසර අමාතයාංශයෙන් ආපු දෙයක් මේ. මෙතෙක් ක්‍රියාත්මක වෙලා නෑ.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** ඒක ක්‍රියාත්මක කරනවා කියලා අපිට කියන්න ඕන නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** පරිසර බලපත්‍රය දීර්ඝ කරන්න මාස තුනකට කලින් ඉල්ලන්න ඕන. ඒක නොඉල්ලන එකේ වරද කාගේද. ඒක දන්නවාද.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** ඒක දන්නවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එහෙම ඉල්ලන්නේ නැතුව අපිට වෙනස් කරන්න බැහැ.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** සභාවක් වුණාම සභාවෙන් යම් අතපසුවීම් වෙනවා. ඒ අතපසු වීම් නිසා දෙපැත්තෙන්ම වැරදි සිදු වෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම අහන්නේ මෙච්චරයි සුගත් මන්ත්‍රීතුමා. දැන් අපි හිතමු වාහන බලපත්‍රයක් කල්ඉකුත් වුණාට පස්සේ අපිට තර්ක කරන්න පුළුවන්ද දඩය ගෙවන්න බැහැ කියලා.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** දඩය ගෙවන්න බැහැයි කියන කතාව නෙමෙයි කියන්නේ. දඩය ගෙවන එක වෙනම ප්‍රශ්නයක්. අසාධාරණයක් වෙලා තියෙනවා. ඒ අසාධාරණයට අපි මේ කතා කරන්නේ. කාටත් අසාධාරණයක් මෙතන වෙනවා. චක්‍රලේඛන දෙකක් තියෙනවා. ඒ දෙකම ගෙන්වලා සංසන්දනය කරලා බලන්න. එක චක්‍රලේඛනයක තියෙනවා මෙම බලපත්‍රය මාස තුනකට කලින් ලබා ගන්න ඕන කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක වෙලා තියෙන්නේ සුගත් මන්ත්‍රීතුමා මෙහෙමයි. චක්‍රලේඛ දෙකක් නැහැ.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** මේක ගැන අහලා බලන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** චුට්ටක් ඉන්නකෝ කියනකම්. චක්‍රලේඛන දෙකක් නැහැ. පරණ නිලධාරියා ක්‍රියාත්මක කරලා නැහැ. අලුත් නිලධාරියා ආවාම එයා ක්‍රියාත්මක කරනවා. එතනයි වෙනස තියෙන්නේ. අලුත් නිලධාරියා චක්‍රලේඛය අනුව ක්‍රියාත්මක කරනවා. මේක අවුරුදු ගාණක ඉඳන් තිබිලා තියෙනවා.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** වාක්‍ය දෙකක් තියෙනවා දෙපළක. මම නැත්නම් මේක තර්ක කරන්නේ නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දෙකේම තියෙනවා. එකක ක්‍රියාත්මක වෙලා නැහැ.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** බැලුවම තේරෙයි. චක්‍රලේඛ දෙකක් තියෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපිට පරිසර කමිටුවේදී සාකච්ඡා කරන්න පුළුවන්. පරිසර නිලධාරීන් එක්ක කතා කරලා සාකච්ඡා කරන්න පුළුවන්. අලුත් දෙයක් නෙමෙයි ක්‍රියාත්මක කරලා නෑ.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** මේ කාරණය අලුත් වන්නේ මේ හින්දා. අපි දැව ව්‍යාපාරයක් පටන් ගත්තා නම් අවුරුද්ද මුල ගන්න ඕන පොරස්ට් එකෙන් අවසර පත්‍රයක්. ඒ අවසර පත්‍රය ගන්න මේ බලපත්‍රය අවශ්‍ය වෙනවා. කාර්යබහුල වීමත් සමගම මේ කාරණය අතපසු වුණා

මොන විදියකින් හරි. දින 20 ක් වගේ තමයි අතපසු වෙලා තියෙන්නේ දැන්. දින 20 ට තමයි මේක කරන්නේ. මේක ගැන නොදන්න අය ඉන්න එක තමයි මේකට ප්‍රශ්නය. අද මේක කලබලයට ගන්න හේතුව තව මාසයක් විතර කල් ගියාම අරහෙන් දඩයක් වදිනවා. මොකද පරිසර බලපත්‍රය ඕන දැව බලපත්‍රය ගන්න. මේක මගේ ප්‍රශ්නයක් විතරක් නෙමෙයි. මේක සමස්ථ රටේ ප්‍රශ්නයක්. සභාපතිතුමා මේක අත්‍යාවශ්‍ය කාරණයක්. මේක තේරුම් ගන්නකෝ. මේ මාසේ කරන්න ඕන එක ලබන මාසෙට ගිහිල්ලා බැනේ. ඒ හින්දයි මේක දැම්මේ. මගේ අතපසුවීම නිසා දින 20 ක් පහුවුණා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මේක තේරුම් ගන්න සුගත් මන්ත්‍රීතුමා. මේ චක්‍රලේඛය දිගටම තිබුණ එකක්. නමුත් කලින් නිලධාරියා ඒක ක්‍රියාත්මක කරලා නෑ. අලුත් නිලධාරියා, නිලධාරියෙක් විදියට ඒක ක්‍රියාත්මක කරනවා. ඒක එකක්. නමුත් අපිට දැන් න්‍යාය පත්‍රයට දාලා තීන්දුවක් ගන්න නම් ගන්න වෙන්නේ ඊළඟ සභාවේදී. ලබුදුව වෙළඳ සංකීර්ණයේ අයත් ඉල්ලලා තියෙනවා මාස 06 ක කාලයක් දෙන්න කියලා වැඩි වුණ මුදල ගෙවන්න.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** එතකොට මේක යන්න බැරි වෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපිට එහෙම වැඩි වෙන එකක් වළක්වන්න බැහැ. ඒක අපි අදාළ නිලධාරියා එක්ක සාකච්ඡා කරලා බලමු. අලුත් නිලධාරියා ඒක ක්‍රියාත්මක කරනවා නම් අපිට එයාට සලකා බලන්න කියලා කියන්න පුළුවන්. මධ්‍යම පරිසර අධිකාරියෙන් ආපු නිලධාරියා සභාවේ නිලධාරියෙක් නෙමෙයි.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** නිලධාරීන් කෙහෙල් ගහ කිව්වොත් කෙහෙල් ගහම තමයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** නිලධාරීන් කියන දේ නෙමෙයි ඕකෙම අනිත් පැත්ත ගත්තොත්.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** මේක අපි තර්ක කරලා ගේමු ජනතාවට සාධාරණයක් වෙන විදියට.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක තමයි පරිසර කමිටුවේදී සාකච්ඡා කරන්නම් කිව්වේ. නැත්නම් මේ සභාවේම මන්ත්‍රීවරු කීපදෙනෙක් කොමසාරිස්ට දන්වාවි සභාවට ලැබිය යුතු මුදල හිතාමතාම වළක්වනවා කියලා. අපි දන්නේ නැද්ද මේක යන විදිය.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** සභාවට දාලා ඒකමතික තීන්දුවක් අපි ඉල්ලන්නේ. ඒක තීන්දු කරන්න බැරිනම් අපිට ප්‍රශ්නයක් නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම අහන්නේ මෙච්චරයි දැන් මේක න්‍යාය පත්‍රයෙත් නැහැ.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** මගේ යෝජනාවට විරුද්ධ අය ඉන්නවාද?.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කැමති අය ඇති. නමුත් තීරණයක් ගන්නේ කොහොමද න්‍යාය පත්‍රයේ නැතුව.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** පරිසර බලපත්‍රයට විතරක් නෙමෙයි අනිත් බලපත්‍ර වලටත් මේක බලපානවා. අපි කියන්නේ එහෙම ගත්තට කමක් නෑ. අලුතින් දෙයක් කරන කොට, කලින් දැනුම් දෙන්න කියලා කියන්නේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඒකට හේතුව මේක මහජනතාව එක්ක කිට්ටුව වැඩ කරන ආයතනයක්. ඒක ගැන දැනුවත් කරා නම් වඩා හොඳයි.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** මේක අය නොකිරීම පිළිබඳව එහෙම නම් ඒ නිලධාරීන්ට විරුද්ධව පියවරක් ගන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මෙහෙමයි. අදාළ නිලධාරිනිය කියලා තියෙනවා එයා අත්සන් කරන්නේ නැහැ මේ මුදල අයකරන්නේ නැත්නම් කියලා. ඒක හින්දා අපි එයත් එක්ක සාකච්ඡා කරමු. මේක මේ ආයතනයේ දෙයක් නෙමෙයි. මේ ආයතනයේ නිලධාරියෙක් නම් අපිට කියන්න පුළුවන්. මේක දීර්ඝ කාලයක් තිබුණ චක්‍රලේඛයක්. එක නිලධාරියෙක් අය නොකර ඉඳීම ඒ නිලධාරියාගේ වැරැද්ද. ඒක තේරුම් ගන්න ඕන. මේ නිලධාරියා අය කරනවා කියන්නේ ඒ නිලධාරියා රාජකාරිය හරියට ඉෂ්ඨ කරනවා.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** මේ නිලධාරියා කියනවා කෙළින්ම මේක වුණේ නැත්නම් අත්සන් කරන්නේ නැහැ කියලා. එහෙම තමයි. අත්සන් කරන්න එපා ඒවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මධ්‍යම පරිසර අධිකාරියෙන් අපිට දීපු බලතලයක් ඒක. අයිතිය මධ්‍යම පරිසර අධිකාරියට.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** ඒක ඒ පාරිභෝගිකයන්ට දැනුම් දීලා කරාට කමක් නෑ. මම කියන දේ තේරුම් ගන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමත් කියන එක තේරුම් ගන්න. මේක අලුතෙන් ආපු එකක් නෙමෙයි.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** කරන එකේ වැරැද්දක් නැහැ. නොකරපු එක්කෙනාට විරුද්ධව පියවරක් ගන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එහෙම තමයි කරන්න වෙන්නේ. නොකරපු නිලධාරියාට විරුද්ධව ක්‍රියාමාර්ගයක් ගන්න ඕන.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** සභාවේ මෙවැනි දෙයක් ආවම සාකච්ඡා කරන්න ඕන. සද්භාවයෙන් මේ කතා කරන්නේ. මේක හරි තැනකට එන්න තමයි අපි මේක ඉදිරිපත් කරේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඉතිං ඔබතුමා මෙතන හිටියත් කරන්න වෙන්නේ මේ දේ මන්ත්‍රීතුමා. මට දැන් තීන්දුවක් ගන්න බැහැ. න්‍යාය පත්‍රයේ මේ දේ නැතුව තීන්දුවක් ගන්න බැහැ. එහෙම නම් ඊළඟ සභාවට යොමු කරන්න. ඒ නිලධාරීන් එක්ක සාකච්ඡා කරලා තීන්දුවක් ගන්න. දැන් ගන්න තීන්දු වලංගු වෙන්නේ නෑ. න්‍යාය පත්‍රයෙත් නැහැ. මට පුළුවන්ද සභාවට ලැබිය යුතු මුදලක් මාස 06 ක් යනකම් වළක්වන්න. මගේ තනි බලයට කොහොමද කරන්නේ ඒක.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** මාස 06 ක් ඕන නෑ. මාස 03 ක් ඇති.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම කොහොමද ඒක කරන්නේ. මාස 03 ක් නෙමෙයි දවසක්වත් බෑ.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** සභාපතිතුමා හරියට තේරුම් අරගෙන නෑ මේක. මේ මුදල නැති වෙන්නේ නෑ. මුදල තියෙනවා. අධ්‍යයනය කරලා නෑ සභාපතිතුමා ඒකයි තියෙන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අධ්‍යයනය කරන්න ඔබතුමා මේක වේලපහ කතා කරන්න එපැයි. මෙතනට දැන් දුන්නට පස්සේ මම කතා කරන්නේ කොහොමද. මේක දැන්නේ දුන්නේ. ඔබතුමා මේක දැන් මෙතනට දීලා තියෙන්නේ. මම වුණේ මොකක්ද කියලවත් දන්නේ නැහැ. නිලධාරීන්ගෙන් අහලා තමයි මට උත්තර දෙන්න වෙන්නේ. ඒක තමයි න්‍යාය පත්‍රයකින් එන්න කියන්නේ. දැනුම් දෙන්න. මම කියන්නේ එහෙම කතා කරන්න එපා සුගත් මන්ත්‍රීතුමා.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** සභාපතිතුමා ඒ නිලධාරිතුමිය දැන් ගෙන්වලා අහන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමාට මතුවුණ ගැටලුව අබේසේකර මන්ත්‍රීතුමා හරහා තමයි දෙන්නෙත්. ඒක ප්‍රශ්නයක් නැහැ. ඒක වෙන කතාවක්. නමුත් මේකට උත්තර දෙන්න මම දැනුවත් වෙන්න ඕන. ඔබතුමාට කරන සාධාරණයක් විදියට තමයි මම ලැබුණු ප්‍රශ්නයට අහ අහා උත්තර දුන්නේ. පරිසර කමිටුවේ සාකච්ඡා නොකර ඒකට තීන්දුවක් ගන්න බැහැ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා, මේකේ පැහැදිලිවම ඉල්ලන ඉල්ලීම වන්නේ ඉදිරි කාලයේදී දෙයක් ආවම දැනුවත් කරන්න. මේ සභාවට එන්නේ ප්‍රදේශයේ ජනතාව එක්ක සම්බන්ධ අය. ඒ නිසා ඒ පිළිබඳව දැනුවත් කරන්න. අලුතෙන් චක්‍රලේඛයක් ආවම දන්නේ නෑ. පරණ තිබුණ විදියටම යන්නේ ඉතිං. අඩු ගානේ එහෙම හරි දාන්න.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා දැන් මේ මතුවෙච්ච පරිසරය සම්බන්ධ ගැටලුවේදී අපි කවුරුත් බොහෝ දෙනෙක් පනත් සම්බන්ධව අවබෝධයක් නැහැ. ඒක නිසා අපිට සුගත් මන්ත්‍රීතුමාගේ එකට සහයෝගය දීලා කතා කරන්නත් බැහැ. ඔබතුමා කියන යෝජනාවට සහය දීලා කතා කරන්නත් බැහැ. ඒ නිසා මේක ලබන මාසයේ සභාවට කල් තියන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ දෙන බලපත්‍රය පිටිපස්සේ සඳහන් වෙනවා මාස තුනකට කලින් ඉල්ලීම කරන්න කියලා. දැන් මෙතන වෙලා තියෙන ප්‍රශ්නය ඒක නෙමෙයි. ඒක සම්පූර්ණයෙන්ම තියෙනවා. මෙතන වෙලා තියෙන්නේ ඉල්ලීම මාස තුනකට කලින් ඇවිත් නැහැ.

කල්ඉකුත් වීමේ දිනයත් පහු වුණාට පස්සේ තමයි ඉල්ලීම කරන්නේ. ඒකට කලින් ක්‍රියාත්මක වෙලා නැහැ.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** ක්‍රියාත්මක නොවුණම ඒ වාසිය ආවෙත් ඔය ව්‍යාපාරය කරන අයට. නීතියට එන කොට ඒ අය ඒකට විරුද්ධයි. නීතිය වෙනස් කරන්න බැහැ දේශපාලඥයින්ට. රටේ නීතියක් තියෙනවා. ඒකට පාර්ලිමේන්තුවේ පනත් සම්බන්ධ වෙන්න ඕන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම ඉන්නේ මෙතන නෙමෙයි. මම කියන්නෙත් මේක සාකච්ඡා කරන්න ඕන. මේක සුගත් මන්ත්‍රීතුමා කියපු එක හරි. මේක සාකච්ඡා කරන්න ඕන. නමුත් අපි මේකේ තීන්දුවක් ගන්න නම් පළාත් පාලන දෙපාර්තමේන්තුවට හරි යවන්න ඕන. එහෙට යවන්න නම් මේක න්‍යාය පත්‍රයෙන් එන්න ඕන. නැතුව අපි මෙතන තීන්දු අරගෙන මාස හයකට මේකට කල් දෙනවා කියලා කිව්වට එහෙම තීන්දු ගන්න එක නීත්‍යානුකූල නෑ.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** මේ රටේ ගම්පහ ප්‍රදේශයේ පරිසරය සම්බන්ධ ප්‍රශ්නයකදී අපි දැක්කා ඔක්සිජන් ඕන නැහැ කියනවා. එහෙම සමාජයක අපි ඉන්නේ. එහෙම පිරිස් ඉන්නේ. එතන ඉඳපු දේශපාලන නායකත්වය දීපු කෙනත් ඒ නිලධාරිනියට විරුද්ධව තමයි කතා කරේ. ඒ ගැන ගොඩක් දුරට මම කතා කරන්නේ නැහැ. විස්තර මම හොඳට දැනගෙන කතා කරන්නේ. ඒක එකක්. ඒක අපි බොහොම කණගාටුවෙන් යුතුව හෙළා දකිනවා. අපිට දේශපාලනය නෙමෙයි වැදගත්. රටේ සමස්ථ ජනතාවටම වෙන හානියක් සම්බන්ධව පුරවැසියෙක් විදියට, මහජන නියෝජිතයෙක් විදියට පෙනී ඉන්න කෙනෙක් ලෙස ප්‍රකාශ කරේ. එතනදී අපේ පවුලේ කෙනෙක් කරත් අපි ඒකට විරුද්ධ වෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මේ සම්බන්ධව කාරණයක් කියන්නේ. ඇත්තටම මේක සාකච්ඡා කළ යුතුයි. ආයතන දෙකක්, මධ්‍යම පරිසර අධිකාරියයි අපියි කියන්නේ ආයතන දෙකක්. ඒ නිලධාරිතුමිය කියලා තියෙනවා එයාට අදාළ නෑ කලින් කෙනා නොගත්ත එක කියලා. දැන් ගන්න, නැත්නම් මට රැකියාව කරන්න බැහැ කියලා. එයා සහභාගි වෙන්නේ නැහැ කිව්වලු කමිටු වලට. ඉතිං මේකට අපි මොන තීන්දුව ගත්තත් අදාළ ආයතන වලින් එන නිලධාරියා එක්ක අපි කමිටුවේ සාකච්ඡා කරන්න ඕන. පරිසර කමිටුව ඉක්මනට කැඳවලා අපි සාකච්ඡා කරමු.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** මේ සම්බන්ධව කතා කරපු නිසා මට තවත් ප්‍රශ්නයක් තියෙනවා. අපේ උක්වත්ත ප්‍රදේශයේ දාලා තියෙනවා ලවණ බාධකයක්. මේක ගැන දැනුවත් ඔබතුමා. එතන පරිසර විනාශයක් වෙනවා මහා පරිමාණයෙන්. පස් දාලා, වෙල ගොඩකරලා ගස් අස්සට වෙන්න මහා ඉදිකිරීමක් කරනවා. දැනටමත් වතුර ටැංකි එහෙම තියලා තියෙනවා. පාරට එහෙම පේන්නේ නැහැ. බන්ට් එකෙනුත්, වෙල මැද්දෙනුත් පස් පුරවනවා. ලවණ බාධකය තියෙන්නෙත් එතන. පරිසර නිලධාරි යවන්න වහාම ඒක පරීක්ෂාවට ලක් කරන්න. නීතිවිරෝධි නම් ඔබතුමා ගන්න ඕනම දෙයකදි අපි ඉන්නවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කොතනද ඔය.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** බන්ට් එක ගාව ලබණ බාධකය තියෙන්නේ. දිනිත් මහතාගේ ගේ දන්නවාද. එතනින් ඉස්සරහ එගොඩහ. ඒක අපි දැකපු විදියට නීතිවිරෝධි ව්‍යාපෘතියක්. පොඩි එකක් නෙමෙයි. මහා පරිමාණයෙන් යනවා. ඒ ගැනත් අවධානය යොමු කරන්න වහාම. ඒ ගැන සිහිපත් කරනවා. සුගත් මන්ත්‍රීතුමා ඉදිරිපත් කරපු කාරණය ඊළඟ න්‍යාය පත්‍රයට ගේන්න. පුළුවන් නම් මේක ගැන මන්ත්‍රීවරුන්ට අධ්‍යයනය කරන්න ඒ පනත් හා චක්‍රලේඛ ලබා දෙන්න. මෙතන සුගත් මන්ත්‍රීතුමාගේ ප්‍රශ්නයේ තියෙන ගැටළුව වන්නේ දැනට කල්ඉකුත් වෙච්ච ඒවාට මොකද කරන්නේ. අය කරනවාද, අය නොකර ඉන්නවාද, මේක ගැන දැනුවත් කරන්න. සුගත් මන්ත්‍රීතුමාටත් ඔය සිද්ධියම වෙලා තියෙනවානේ. දැන් ඒවාට මොකද කරන්නේ.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** එහෙම ප්‍රශ්න වෙච්චා නැතුව ඇති.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අනිත් ඒවා කලින් ඉල්ලනවාද?.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** මට වුණේ කාර්ය බහුලත්වයත් එක්ක දින 20 ක් පරක්කු වුණා. ඒ දවස් 20 පරක්කු වීම නිසා මම දැන් නීතිවිරෝධි ව්‍යාපාරිකයෙක් වෙනවා. ඇයි මම අරහෙන් දැව බලපත්‍රය ගන්නේ නැනේ. මට ඒ ප්‍රශ්නය ආවේ. ඒක හින්දා මම නිලධාරීන් එක්කත් සුහදව කතා කරලා තමයි සභාවට මේ යෝජනාව ගෙනාවේ. ඊයේ මම ලේකම්තුමා එක්කත් කතා කරා. පරිසර නිලධාරිතුමිය එක්කත් කතා කරා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දැන් බලන්න ඔබතුමාලා ඔක්කොම සාකච්ඡා කරලා. මට මෙතනට ලියුම දෙනවා. මම උත්තර දෙන්න ඕන.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** ඔබතුමාව අපහසුතාවයට පත්කරන්න හැදුවේ නෑ මම. මම කිවුවේ ලිපි දෙක බලලා තීන්දුවක් ගන්න. එතන වැරැද්දක් තියෙනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, මම සියලු මන්ත්‍රීවරුන්ගේ අවධානය විනාඩියකට යොමු කරනවා. මොකද හේතුව විරෝධාකල්පයක් නෙමෙයි. කවුරුත් එක තැන ඉඳගෙන මේ වැඩේ කරන්න ඕන. ප්‍රියන්ත මන්ත්‍රීතුමා මතුකරපු දේ කියන්නේ. අද මෙහෙම යන්න ගියොත් හොඳ නෑ. මමත්, එතුමත් මේක පිළිබඳව කතා කරාට පස්සේ අපි ගියා මේක බලන්න. ඇත්තටම මේක මාධ්‍යයටත් ගිහින් තියෙනවා යම් මට්ටමකට.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මාව දැනුවත් කරලා නෑ. සිරංගිකා ජනමාධ්‍යවේදීතුමියත් මගෙන් ඇහුවා. එතුමිය තමයි මට මුලින්ම කිවුවේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඔබතුමා බලන්න කිලෝමීටර් ගාණක් පස් ගෙනල්ලා දානවා. ගොඩකරනවා. ඒක දැන් කාලයක් තිස්සේ යන ව්‍යාපාරයක්. ඒක හින්දා මේකට කාගෙන්වත් විරෝධාකල්පයක් නැහැ. මේකට වහාම තීරණයක් ගන්න ඕන මේ සභාවේ.

**ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය ඃ-** ඒ වගේම ගරු සභාපතිතුමා, සභාවේ මුදල් වියදම් කරලා හදපු තොටිවත්ත පාරේ දැන් වාහන යන්න බැහැ. ඔක්කොම පාර කැඩිලා ඉවරයි. මුල් හරිය ගන්නම දෙයක් නෑ. මිනිස්සු හරියට චෝදනා කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මොකකින්ද ඒක කෙරෙන්නේ.

**ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය ඃ-** මොකකින්ද කියලා හොයාගන්න තොරතුරක් නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** බිල්ඩින් හදලද.

**ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය ඃ-** ඔව් ලොකු බිල්ඩින් එකක් හදලා. මොකක් හරි ලොකු දෙයක් කරනවා එතනට යන්න බැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දැන් යන්න තාක්ෂණ නිලධාරිතුමිය. වාහන නැත්නම් මගේ කැබ් එකේ යන්න. පරිසර නිලධාරිත් එක්ක යන්න.

**ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය ඃ-** ලොකු දෙයක් මේ වෙලාවේම යනවා නම්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දැන් ගිහින් බලලා, තහනම් කරලා, නවත්වලා, එන්න. ජල සම්පාදන මණ්ඩලයේ කාර්යාලයට අයිනෙන් තියෙන පාරේ.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** වෙල හරහා පස් ගොඩකරලා තියෙනවා. යනකොට පේනවා. ගොඩකරපු පස් දිගේ යන්න. බන්ට් එකේ යනකොට ලවණ බාධකයට මෙහා වෙල හරහා බන්ට් එක අයිනෙන් වක්වැල්ලේ ඉඳන්ම පස් දාලා ගොඩ කරලා පාර හදාගෙන ඇවිල්ලා. වෙල ගාව තියෙනවා අපේ පැත්තෙන් යන ගඟ. ඒ ගඟ පැත්තට වෙල මැදින් පස් දාලා තියෙනවා. ඒ පාරෙන් කෙලින්ම කැලේ ඇතුලට යන්න. වහලා හදන්නේ. ඒක පේන්නේ නෑ කොහාටවත්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** සුගත් මන්ත්‍රීතුමා මතු කරපු කාරණයට පරිසර කමිටුව කැඳවලා අපි ඉක්මනට තීන්දුවක් ගන්නම්. ඊළඟ සභාවේ යෝජනාවක් විදියට ඉදිරිපත් කරන්න ඔබතුමා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** අපේ ප්‍රියන්ත මන්ත්‍රීතුමා මතු කරපු කාරණයට ඔබතුමා අවධානය යොමු කරලා, ඔබතුමා ප්‍රශ්නයක් වෙන්න ඉස්සෙල්ලා ඔබතුමා ක්‍රියාත්මක වෙනවා නම් හොඳයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දැන් යැව්වා ඔබතුමා දැක්කානේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඒක ලොකු ව්‍යාපෘතියක්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** න්‍යාය පත්‍රයට යමු.

**(ඇ) යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න ඃ-** නැත

**(ඉ) යථා පරිදි කල් දී ඇති යෝජනා**

<u>ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමාගේ යෝජනා</u>

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ- 01.** හපුගල, මවුන්ට්ප්ලසන්ට් වත්ත, කීර්ති මහතාගේ නිවස අසල මාර්ගය සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රිනි පී. ටෙක්ලා ශ්‍යාමලී මැතිණිය ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**02.** හපුගල, වෛද්‍ය මලින්ද ඒකනායක මහතාගේ නිවස අසල මාර්ගය සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රිනි පී. ටෙක්ලා ශ්‍යාමලී මැතිණිය ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**03.** 2020 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම අනුමත කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා විනාඩියක් අවසර දෙන්න ඔබතුමා. ඔබතුමාගේ යෝජනා වලට දැම්මා නම් හොඳයි. ආරංචියක් තියෙනවා. ඒක ඇත්තටම හොඳ දෙයක්. මෙච්චර දවස් නොලැබුණ දෙයක්. කාපට් පාරවල් ලොකු ප්‍රමාණයක් ඇවිල්ලා තියෙයි. ඒක හින්දා ඔබතුමාගේ අවධානය යොමු කරලා සභාවට දාන්න. අපි ඉල්ලන්නේ නැහැ පෞද්ගලිකව. ඇත්තටම විශේෂයෙන් අපේ පැතිවල තියෙන ප්‍රශ්න අඩුයි. ඕපාත පාර කාපට් කරනවා නම් ඉතාම වටිනවා. නමුත් ඇත්තටම යන්න බැරි තත්ත්වයේ තියෙනවා මාටින් පෙරේරා මාවත, ඊළඟට කාසල් වත්ත, නරාවල ඒ වගේ පැතිවල පාරවල්. ඒවාටත් මේක දාලා ක්‍රියාත්මක කරන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මට මේ වෙලාවේ හරියට කියන්න බැහැ. අනුමත වෙලා ආවට පස්සේ කියන්නම්. දැනට දාලා තියෙනවා ආරංචි විදියට. මේක රමේෂ් පතිරණ ඇමතිතුමත් දාලා තියෙනවා. මමත් දාලා තියෙනවා. පළාත් සභාවෙනුත් දාලා තියෙනවා. එහෙම ආපු පාරවල් කීපයක්ම තියෙනවා. ප්‍රධාන පාරවල් ටික හැදෙනවා. මම නිකං දළ වශයෙන් කියන්නම් මතක විදියට මාටින් පෙරේරා මාවත, පන්විල පාර, ගොඩකන්ද පාර දාලා තියෙනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** සභාවට ඇවිල්ලා තියෙනවානේ වෙනම ප්‍රමාණයක්. ඒක ඇත්තටම පැතිරිලා යන්න දාන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මෙහෙමයි අබේසේකර මන්ත්‍රීතුමා. රමේෂ් පතිරණ ඇමතිතුමා එක්කත් මම සාකච්ඡා කරා. එතුමා කිලෝ මීටර් 25 ක් දාලා තියෙනවා. මේ දෙක හැප්පෙන්න බැහැ. එතුමා දාන යෝජනා මට දාන්නත් බැහැ. කොහොම හරි එතුමත් බෝපෙ පෝද්දලින් දාලා තියෙනවා. මමත් දාලා තියෙනවා කිලෝමීටර් 15 ක් විතර. ඒ ඒ කොට්ඨාශවල් නියෝජනය වෙන්න තමයි අරගෙන තියෙන්නේ. උදාහරණයක් විදියට නරාවල මාටින් පෙරේරා මාවත, පන්විල පාර, මීපාවල පන්සල පාර, ගොඩකන්ද පාර ඒකට ඔබතුමන්ලා රන් මාවත බෝඩ් ගහලා අයින් කරා. ගොඩකන්ද කරාපිටිය පාර, සේරියගොඩ පාර, මොල්ලිගොඩ පාර, ජන උදාන පාර, මුලන පාර, තුන්හිරිපාන බටුවන්තුඩාව පාර දාලා තියෙනවා.

**ගරු මන්ත්‍රිනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය ඃ-** සභාපතිතුමා අර බටුවන්තුඩාව පාර කාපට් කරනවා නම් වක්වැල්ල හන්දියෙන් පාරට ඇතුල්වෙන තැන පටුයි. ඒක හදන්න ඕන. මිනිස්සු ඒ පාරේ ඇතුලේ ඉඩම් වල වැටවල් ගහලා අල්ලගෙන තියෙන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** බලමු ඒක. නාගරුක්ඛාරාම පාර, මිහිඳු මාවත, පැලවත්ත, අපේගම පාර කොහොම හරි ඔය පාරවල් ටික කරාම පාරවල් හදන්න නැති වෙයි.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** වැලිපිටිමෝදරත් එකපාරක් හරි හදන්න ඕන සභාපතිතුමා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමා යෝජනා දාන්න එපැයි. ඔබතුමා යෝජනා දෙකක් දුන්නා කිව්වා නේ.

**ගරු මන්ත්‍රිනි පී. ටෙක්ලා ශ්‍යාමලී මැතිණිය ඃ-** ඔබතුමා මගේ කොට්ඨාශයේ නිසා මම කරපු ටිකේ ඉතුරු ටික කරන්න කියනවා. හපුගල කොට්ඨාශයේ ඉතුරු ටික කරන්න. කිසි දෙයක් කරලා නැනේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කවුද කරලා නැත්තේ.

**ගරු මන්ත්‍රිනි පී. ටෙක්ලා ශ්‍යාමලී මැතිණිය ඃ-** හපුගල වසමේ කරලා නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** හපුගල වසමේ මම තරම් කරලා නෑ කවුරුවත්. ඔබතුමිය කියන්නේ මේ මාස ගානේ. මේ අවුරුද්දේ හපුගල කොට්ඨාශයට තරම් වැඩ කරලා නෑ කොහේටවත්.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** පෝද්දල, මීපාවල පැතිවලට විශේෂත්වයක් දීලා වැඩ කරන්න කියලා මම ඉල්ලා සිටිනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** වෙනදා ඔබතුමන්ලාට ඔහොම කතා කරන්නවත් තිබුණේ නෑ. වෙනදා සභාපතිවරයා 75% ක් ගන්නවා. ඉතුරු 25% තමයි මන්ත්‍රීවරුන්ට බෙදන්නේ. දැන් සභාපතිවරයා ගන්න මුදල කොට්ඨාශයේ අනිත් මන්ත්‍රීවරුන්ටත් බෙදනවා. ඔබතුමන්ලා ඔහොම කතා කරන්න එපා.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** සමස්ථයක් හැටියට ඒ කොට්ඨාශයේ චන්දිම වීරක්කොඩි ඇමතිතුමා හිටියා. මාදුගොඩ පළාත් සභා මන්ත්‍රීතුමා හිටියා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කරන්න දෙයක් නැහැ. ඒ සිද්ධ වෙච්ච දේවල්.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** ඒ ඔක්කොටම වඩා නිලධාරි පැලැන්තියක් ඒ කොට්ඨාශයේ ඉන්නවා. ඒ අය කොහේ හරි තියෙන සල්ලි ටික ගෙනල්ලා ඔය කොට්ඨාශයේ වැඩ ටික කර ගන්නවා. වලවත්ත, නරාවල, මීපාවල, පෝද්දල වගේ ප්‍රදේශවල ඉදිරි කාලයේ යෝජනා කරලා තියෙනවා කරන්න. ඒ ප්‍රදේශ වල පහුගිය කාලයේ මන්ත්‍රීවරුන් හිටියේ නෑ. ඒ කොට්ඨාශ වලට මොකක් හරි දෙයක් වෙන්න ඕන.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මෙතුමිය විශාල වැඩ කොටසක් කරා ඇත්තටම. ඒකට හේතුව මේකේ අබේසේකරලාට මුකුත් දෙන්නේ නැහැ. පාරක් එහෙම දෙන්නේ නෑ. මම ඇත්තටම ඉල්ලා සිටිනවා චමින්ද මන්ත්‍රීතුමාගෙන් ඕපාත වගේ ප්‍රදේශ වලට වැඩ ටිකක් කරන්න කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ කියපු දේ තේරුණේ නෑ අබේසේකර මන්ත්‍රීතුමා. ඔබතුමාට නොලැබෙන්නයි එතුමියට ලැබෙන්නයි හේතුව මොකක්ද.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** දක්ෂතාවය.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** එහෙම කියන්න එපා අපිට දීලා තියෙනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** දැන් ශ්‍යාමිකා මන්ත්‍රීතුමිය වැඩ තොගයක් කරලා තියෙනවා. මටමයි නැත්තේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ- 04.** බටුවන්තුඩාව මංසන්ධියේ ඇති පීල්ලේ ජලය එක්රැස්වන ටැංකිය සුද්ධ පවිත්‍ර කිරීමට හැකිවන සේ පතුල කොන්ක්‍රීට් කිරීමටත්, බටුවන්තුඩාව පන්සලේ ඇති ජල බුබුලේ සිට ජලය එක්රැස්වන ටැංකිය දක්වා භූගත නල පද්ධතියක් එළීමටත්, කාණු වලින් එන ජලය ටැංකියට එක්රැස්වීම වැළැක්වීම සඳහා අවශ්‍ය ක්‍රියා මාර්ග ගැනීමටත් යෝජනා කරමි.

**ගරු මන්ත්‍රිනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා, මම ඒක ගැන කතා කරන්න හිටියේ විශේෂයෙන්ම. ඔබතුමාට බොහොම අදාළයි. ඔබතුමා මේක දන්නවා. ඔබතුමා මේ සටනේ හිටියා. ඇත්තටම මේ සටනේදී ඔබතුමා දන්නවා අල්ලස් හා දූෂණ විමර්ශන කොමිෂන් සභාවටත් ගියා. නමුත් කොහේ ගියත් ඒවා මේවා කරනවා. ඉතාම පැහැදිලිව ඇක්සස් ඉඩමේ ඉස්සරහ කැල්ල වෙන්දේසි කරන්න නොදිය යුතුයි කියන බොහොම පැහැදිලි තීන්දු අරගෙන තියෙනවා. ඒ තීන්දු තීරණ අරගෙන තියෙද්දි තමයි ඒක වෙන්දේසි කරන්න දුන්නේ. වෙන්දේසි ඉඩම්වල අනවසර ඉදිකිරීම් ගැන වාර්තාවක් හදාගෙන යනවා. ඒක ඉතාම ඉක්මනින් අපි ඉදිරිපත් කරන්නම්. නමුත් මේ වෙච්ච වැරැද්ද, කන්දෙන් එන වතුර ප්‍රමාණය නතර කර ගන්න පුළුවන් ප්‍රමාණයේ කාණු නෙමෙයි දැම්මේ. ඒක වෙන්දේසි සමාගම කරන්න ලෑස්ති වෙලා තිබුණ එකක්. හැබැයි කාලකන්ණි දේශපාලඥයන්ගේ තරම ඒක 'අයි ප්‍රොජෙක්ට්' එක යටතේ දාලා කෙරෙව්වා. 'අයි ප්‍රොජෙක්ට්' එක යටතේ දාලා කරාම පොදු වැඩ කරන්න තිබුණ සල්ලි නැති වුණා. මේක පිළිබඳව ගරු සභාපතිතුමා

මම එවකට ඉඳපු සියලු දෙනා එකතු වෙලා අල්ලස් හා දූෂණ විමර්ශන එකටත් දැම්මා මේ සභාවේ යෝජනාවකුත් ගෙනල්ලා. අවාසනාවන්ත විදියට ඒවාට මුකුත් වුණේ නෑ. ගිනැන්ස්කාරයාට උදවු වෙන විදියට තමයි මේ සියලු දේවල් කරේ. ඇත්තටම මම අද ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා මේ පීල්ලේ තියෙන ස්වාභාවික ගතිය නැති කරන්න යට කොන්ක්‍රීට් කරන්න එපා. අදටත් කරන්න තියෙන්නේ හරි කාණු පද්ධතියක් දාලා පීල්ල මඟඇරලා යන විදියට හදන්න. මොකද ස්වභාවික ගතිය නැති වෙනවා. වතුර ටැංකියක් වෙනවා. මඩ රැඳෙනවා කාලයක් යනතුරු. තව අවුරුදු 25 ක් 30 ක් යනතුරු මේ මඩ ඒම නතර වෙන්නේ නෑ. මොකද සැරින් සැරේ තමයි අර කන්දේ ගෙවල් හදන්නේ. ඒක සම්පූර්ණයෙන්ම මේකට බලපානවා. සභාපතිතුමා දන්නවා සම්පූර්ණ සිද්ධිය. වෙච්ච දේත් දන්නවා. කරන්න ඕන දේත් දන්නවා. ඒ වෙච්ච දේත් දන්න සභාපතිවරයෙක් හැටියට මම ඔබතුමාගෙන් ඉතාම ගෞරවයෙන් ඉල්ලනවා. ඔබතුමා සද්භාවයෙන් ගේන්න ඇත්තේ මේ යෝජනාව. කළ යුත්තේ මේක නෙමෙයි.

(ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා සභාවට සහභාගිවීම සිදුවිය.)

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මෙහෙමයි අබේසේකර මන්ත්‍රීතුමා ඔබතුමා කියන එක හරි. මොන ආයතනයෙන් හරි ඒ කාණු පද්ධතිය කොන්ක්‍රීට් වුණා. වැරදි විදියට වුණේ. ඒක අදාළ වෙන්දේසි ආයතනයට තමයි කරන්න තිබුණේ. නමුත් ඒ කොන්දේසි අයින් කරලා දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරියෙන් ඒක කරා. ඒක වැරදියි. නමුත් මෙතන තියෙන ගැටලුව ඒක නෙමෙයි. ඔතනින් යන්න බැහැ වහින කාලයට ඔය මුළු ගමේ ඔතන ඉන්න කොල්ලෝ ටික බනින එක තමයි කරන්නේ. මොකද හේතුව මඩ ටික ගිහිල්ලා සම්පූර්ණයෙන්ම අරකේ තැන්පත් වෙනවා. ඉවත් කරන්න විදියක් නෑ. තැනින් තැන ගල් තියෙන්නේ. අස් කරන්න විදියක් නෑ. සභාවෙන් පුළුවන් වුණාම කම්කරුවෝ දානවා. ඒත් බනින එක තමයි කරන්නේ. අබේසේකර මන්ත්‍රීතුමා මෙතන ටැංකිය තිබුණට මෙතන උල්පත් නෑ. බුබුල තියෙන්නේ උඩ. මෙතන බලාපොරොත්තු වෙන්නේ පස් ආවම ඉක්මනට අයින් කරන විදියක්. වතුර උනන උල්පත් තියෙන්නේ උඩ. බුබුල ළඟ ඉඳන් කෙළින්ම බට ලයින් එකක් ගෙනල්ලා පතුල කොන්ක්‍රීට් කරන්නයි මේ යෝජනා කරේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා ඒක නෙමෙයි ප්‍රශ්නය තියෙන්නේ ඇත්තටම. ඔය කියන කතාව හරි. ඒ පැත්තෙන් එන්නේ. නමුත් ප්‍රශ්නය තියෙන්නේ එතන නෙමෙයි. තව අවුරුදු 25 ක් 30 ක් යනකම් මේ මඩ එනවා. මේ මඩ ඒම වළක්වන්න බෑ. මඩ ඒම වළක්වන්න නම් කරන්න ඕන එකම දේ තමයි කලින් අපි යෝජනා කරපු විදියට, විරෝධතාවය මැද්දේ මේක දුන්නට පස්සේ අපි යෝජනා කරා මඩ පොඩ්ඩක්වත් යන්නේ නැතුව පළල් කාණුවක් එක්ක මේක හැරවිලා යන ක්‍රමයක් හදන්න කියලා තාක්ෂණ දැනුම අරගෙන. ඒක කරේ නෑ. අදටත් කරන්න තියෙන හොඳම දේ ඇත්තටම ඒක. එහෙම නැතුව මේක කොන්ක්‍රීට් දැම්මම ස්වභාවික ගතිය ඉවරයි. අවුරුදු සිය ගාණක් තිබුණ එකක් මේ. ඒ කියන්නේ ගලෙන් ගලට වතුර හැප්පිලා යනකොට තමයි ඒක එන්නේ. වෙනදා ඇත්තටම මතක් කරන්න ඕන. බට්ට කලු මැතිතුමා ඉන්නකොට ඇත්තටම එතුමා තමයි මේක සුද්ධ කරවන්නේ කොල්ලොන්ට කන්න බොන්න ටිකක් දීලා. ඒක සුද්ධ කරවලා ලස්සනට ඒක තියාගෙන හිටියා. පිටින් පවා මිනිස්සු නාන්න ආවා. අද නාන්නේ මඩ වතුර. ඉතිං ඒක නිසා මේක කොන්ක්‍රීට් කරනවා කියන්නේ තටාකයක් හැදුවා වගේ. තටාකයක් හැදුවට වැඩක් නෑ පස් එනවා. මඩ වතුර එනවා. බුබුලෙන් වතුර මෙතනට ගෙනාවා කියන කතාව විතරක් නෙමෙයි තියෙන්නේ. ඒ නිසා කරන්න ඕන දේ තමයි එක්කෝ ඒ වතුර යන කාණු පද්ධතිය හදලා මඩ, පීල්ල පහුකරලා යන විදියට හදන්න ඕන. එහෙම නැතුව මොකක් කරත් වැඩක් නෑ. බාධකයක් දාලා යවන්න ඕන. මේක කොන්ක්‍රීට් කිරීම මේකට විසඳුමක් නෙමෙයි. එතකොට වෙන්නේ මඩ තියෙනවා. මේකෙන් වෙන්නේ කොන්ක්‍රීට් කරන්න තව ගාණක් යන එක විතරයි. පතුල කොන්ක්‍රීට් කරාම හරි නෑනේ. ඒත් මඩ එනවානේ. ඒ මඩ ලේසියෙන් අස්කරන්න පුළුවන් එක විතරයි වෙන්නේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, මම හිතන්නේ මේ යෝජනාව මේ සභාවටම මමයි ප්‍රියන්ත මන්ත්‍රීතුමයි අපි කතාකරලා යෝජනා කරලා සාකච්ඡා කරපුවා. ඇත්තටම දැන් තියෙන ප්‍රශ්නය මේ පොකුණට එකතු වෙන වතුර එක්ක මඩ වැටෙන එක. පොකුණ යට කොන්ක්‍රීට් කරලා හෝ පොකුණ පිළිසකර කරපු පමණින් මඩ එන එක නතර වෙන්නේ නැහැ. ඒත් මඩ එනවා. ඔබතුමා කියන පරිදි මඩ ටික අයින් කරන්න මොකක් හරි කරන්න ඕන. වඩා හොඳම විකල්පය තමයි මේකට පිටතින් මඩ එන එක නතර කරන එක. මඩ එන්නේ නැති විදියට පිටත හදන එක. බාහිරින් දිය පහරට මඩ එකතු වෙන ක්‍රමයක් තියෙනවානේ. අන්න ඒක වළක්වන්න ක්‍රියාමාර්ග ගන්න. පොකුණ පතුලේ අභ්‍යන්තරය කොන්ක්‍රීට් කරනවාට වැඩිය ඒ ස්වභාවික ගල් තියෙන විදියටම තිබුණම වඩා සුදුසුයි. ඔබතුමා මේකට දරන්න හදන පිරිවැය යම් ප්‍රමාණයක වෙනසක් වුණත් ඉතාම කාලෝචිත නිවැරදිම ක්‍රමවේදය තමයි බුබුලේ සිට පොකුණට වතුර එන මාර්ගයට එකතු වෙන මඩ ප්‍රමාණය අවම කරන එක. ඒක නිසානේ මඩ එන්නේ. වෙන ක්‍රමයක් නෑනේ මඩ එන්න. පොකුණට මඩ එන්නේ බුබුලේ ඉඳන් එන වතුර පාරට මඩ එකතු වෙලා හෝ

කාණු වලින් එන වතුරට මඩ එකතු වෙලා. බුබුලේ සිට පොකුණ දක්වා ජලය එන මාර්ගය බට දාලා හරි දෙපැත්තේ බැම්මක් දාලා හරි හදන්න. ඒක සුදුසුයි. වතුර පාරට මඩ එකතු වෙන එක නතර කරන්න ක්‍රමවේදයක් හදන්න කියලා මෙම යෝජනාව සංශෝධනය කරන්න කියලා ඉල්ලා සිටිනවා. මම හිතන්නේ ඒක ඔබතුමාට පැහැදිලි ඇති. වියදම අඩු වැඩි වුණත් ඒක වඩා කාලෝචිතයි පොකුණ එහෙම නඩත්තු කරන එක. ඒ නිසා මම යෝජනා කරනවා මේ යෝජනාවටම සංශෝධනයක් හැටියට මේ පොකුණ කොන්ක්‍රීට් කරනවා වෙනුවට මේකට මඩ එකතු වෙන එක වළක්වන්න ක්‍රියාමාර්ගයක් සකස් කරන්න.

**ගරු මන්ත්‍රිනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය ඃ-** මටත් ගරු සභාපතිතුමා ඕකට කාරණයක් එකතු කරන්න පුළුවන්. බුබුලෙන් එන වතුර වල මඩ එන්නේ නැහැ. බුබුලෙන් එන වතුර ටික බොහොම පිරිසිදුවට එනවා. ඉහළින් එන වතුර මේ වතුරට එකතු වෙන නිසා තමයි මේකට මඩ එකතු වෙන්නේ. පීල්ලේ ටැංකියේ හදන්න දෙයක් ඇත්තටම නැහැ. යටත් ගල් අල්ලලා ඒ තත්ත්වයෙන් තියෙනවා. කිසි ප්‍රශ්නයක් නැහැ. අලුතෙන් හදන්න කියලා දෙයක් නැහැ. අර බුබුලෙන් එන වතුර ටික පීල්ලටත්, ඉහළින් එන වතුර ටික වෙන මාර්ගයකින් කොහෙට හරි යවන්න පුළුවන් නම් හොඳයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ යෝජනාව සම්පූර්ණයෙන්ම බැලුවද, ඒක මේකේ තියෙනවා. ඉන්දික මන්ත්‍රීතුමා කියපු එකත් මේකේ තියෙනවා. ඒ සම්පූර්ණ ක්‍රියාවලිය මේකේ තියෙනවා.

**ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය ඃ-** මම කිවු  වේ ඒකයි පැහැදිලි කරලා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** මම යෝජනා කරනවා මේ පතුල කොන්ක්‍රීට් කරන එක කරන්න ඕන නැහැ. පතුලට මඩ එකතු වෙන එක නවත්වන්නයි ඕනකම තියෙන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මේකේ තියෙනවානේ මන්ත්‍රීතුමා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** පතුල කොන්ක්‍රීට් කරනවා කියන එක මේකට අදාළ කර ගන්නේ නැතුව ඉන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අර ටික කරලත් හරි නොගියොත් මොකද කරන්නේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඔබතුමාගේ යෝජනාව නිවැරදියි. මේ යෝජනාව ක්‍රියාත්මක කරන්න. මේ ඉල්ලීම ක්‍රියාත්මක කරන්න. මේක ක්‍රියාත්මක කරන්නයි ඕනකම තියෙන්නේ. මේක ක්‍රියාවට නගද්දි නිවැරදිම විදියට ස්වාභාවිකත්වය ආරක්ෂා වෙන විදියට, නිවැරදිම විදියට, ක්‍රමවේදයකට කරන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක තාක්ෂණික උපදෙස් අනුව මම බලන්නම් කරන්නේ කොහොමද කියලා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** බොහොම ස්තුතියි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**(තේ පානය සඳහා සභාව කල් තබන ලදී.)**

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, ගයාන් මන්ත්‍රීතුමාගේ යෝජනා ඉදිරිපත් කරන්න කලින් මම පොඩි අවසරයක් ඉල්ලා සිටිනවා. මේ මොහොතේ විශේෂ කාරණයක් තියෙනවා. අපේ රටේ මේ වෙන කොට තියෙන අර්බුදය මුල් කරගෙන දරුණු අධිරාජ්‍යවාදී වටලෑමක් මේ මොහොතේ ක්‍රියාත්මක වෙමින් පවතිනවා. ඒ සම්බන්ධව පොඩි කාරණයක් මතු කර ගන්න අවස්ථාව ඉල්ලා සිටිනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මේ ටික යනකම් ඉන්න මම වෙලාව දෙන්නම්.

**<u>ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමාගේ යෝජනා</u>**

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ- 05.** ගිංතොට තුනී ලැලි සංස්ථාව රාජ්‍ය ආයතනයක් ලෙස දහස් ගණනකට රැකියා සැපයීම පමණක් නොව ලංකාවටම අවශ්‍ය තුනී ලැලි සැපයීම, විදේශ විනිමය ඉපයීම, ප්‍රදේශයේ ජන ජීවිතයට රැකුලක් වෙමින් 'ගිංතොට' යන නාමය ප්‍රචලිත කළ ආයතනයකි. රටට සම්පතක් වූ තුනි ලැලි සංස්ථාව හා යන්ත්‍ර සූත්‍ර කුණු කොල්ලයට විකුණා දැමීමට

දායක වූ සියලුම දෙනාට පමණක් නොව ඔවුන්ගේ දරුවන්ටද එම ශාපයෙන් ගැලවීමක් නැත. මෙම මහඟු සම්පත නැවත රජයට පවරා ගන්නා ලෙසත් කර්මාන්තශාලාව පණගන්වන ලෙසත් රටට ආදරය කරන මහජන නියෝජිතයන් ලෙස නොබියව ගන්නා ලද තීන්දුව පිළිබඳව අතිගරු ජනාධිපතිතුමාට, ගරු අගමැතිතුමාට, ගරු කථානායකතුමාට, ගරු විපක්ෂ නායකතුමාට, ගරු ඉඩම් අමාත්‍යතුමාට, ගරු කර්මාන්ත ඇමතිතුමාට, ගරු දකුණු පළාත් ආණ්ඩුකාරතුමාට, ගාල්ල දිස්ත්‍රික් ලේකම්තුමාට, ඉඩම් කොමසාරිස්තුමාට, නාගරික සංවර්ධන අධිකාරියේ සභාපතිතුමාට, දකුණු පළාත් පළාත් පාලන කොමසාරිස්තුමාට, වාර්තාවක් සකසා යැවීමට යෝජනා කරමි. විශේෂයෙන් මෙම තීරණය බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාවේ පොදු තීන්දුවක් බවත් ඉඩම රජයට පවරාගන්නා තෙක් හෝ අත්පත්කරගන්නා තෙක් පොදු අරමුණකින් සභාවක් ලෙස වගකීම භාර ගැනීමටත් යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, මේ ගිංතොට තුනී ලැලි සංස්ථාව ගැන කතා කරන කොට මුලින්ම මේ ප්‍රශ්නය පිළිබඳව සුගත් මන්ත්‍රීතුමාටයි මටයි දැන ගන්න ලැබුණේ 2019.05.04 වෙනිදා. ඉතිං එදා ඉඳලා අපි මේක නැවත රජයට පවර ගන්නේ කියන තැන හිටියා. ලොකු අරගලයක් මේ වෙන කොට කරගෙන ආවා. මේ වෙන කොටත් කරගෙන යනවා. ඉතිං දැන් පහුගිය දිනක අපි විශාල උද්ඝෝෂණයක් කරා මාර්ගය අවහිර කරමින්. ඉතිං මේ කරපු අවස්ථාවේදී මුද්‍රිත මාධ්‍ය වලින්, විශේෂයෙන්ම ලංකාදීප පත්තරයෙන් අරගලය පටන් ගනිපු දවසේ ඉඳලා අද වෙනකම් අපිට විශාල හයියක් ලබා දුන්නා. ඒ වගේම අනෙකුත් පුවත්පත් සියල්ලම අපිට විශාල ශක්තියක් ලබා දුන්නා. ඒ වුණාට රූපවාහිනී මාධ්‍ය කිසිම එකක මේක පළ කිරීම සිදු වුණේ නෑ. ඒ නිසා මෙහෙම වෙලා තියෙන්නේ ඇයි කියලා අපිට විශාල ගැටලුවක් තියෙනවා. ඇයි මෙහෙම හැසිරෙන්නේ කියලා ප්‍රශ්නයක් තියෙනවා. අපි සියලු මාධ්‍ය ආයතන වලට දැනුවත් කරමු. මේක පොඩි දෙයක්. මේ සභාවේ මම මාලුපාන් ගෙඩියක් ගෙනල්ලා මෙහෙම අත ඉස්සුවත් හැන්දෑවට ඒකට ඉඩක් වෙන් වෙනවා මාධ්‍යවල. හැබැයි මේ සිද්ධිය පිළිබඳව ලොකු කුතුහලයක් අපිට තියෙනවා. මාර්ගය අවහිර කරලා කරේ. තාමත් කරාපිටිය රෝහලේ ප්‍රතිකාර ලබනවා එදා උද්ඝෝෂණයට සම්බන්ධ වුණ කෙනෙක් අනතුරට ලක් වෙලා 6 වාට්ටුවේ. ඒ කිසි දෙයක් මාධ්‍ය ආයතන වලින් පළ වුණේ නෑ. ජනමාධ්‍යයයි, ජඩමාධ්‍යයයි හඳුනා ගැනීමේ ප්‍රශ්නයක් තියෙනවා. විශේෂයෙන්ම මුද්‍රිත මාධ්‍ය ආයතනයි, ලංකාදීප පුවත්පතයි මේක පටන්ගනිපු දවසේ ඉඳලා අපිට සහය ලබා දුන්නා. ඒකට විශේෂ ස්තූතිය මම පළ කරනවා. මේ යෝජනාවේ ඇතුල් කරලා නෑ පරිසර ඇමතිතුමයි, ප්‍රාදේශීය ලේකම්තුමයි. ඒ අයටත් ඒක දැනුම් දෙන්න.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, මේ යෝජනාව ඉතාම කාලෝචිතයි. අපි සභාව හැටියට වගකීම පවරා ගනිපු සිද්ධියක් මේ. මේ සිද්ධියේදී විශේෂයෙන්ම ගිංතොට තුනී ලැලි සංස්ථාව පෞද්ගලික පාර්ශවයකට පවරා දීමට ගනිපු ක්‍රියාමාර්ගයට එරෙහිව මේ සභාව හැටියට ක්‍රියාත්මක වෙච්ච වෙලාවේ මුල් අවස්ථාවේ ඉඳගෙනම මේ සභාවේ අපි මතක් කරන්න ඕන සුගත් කලංසූරිය මැතිතුමා, ගයාන් ගීතික ලියනගේ මැතිතුමා, මේ ප්‍රශ්නය මතු කරලා මේ සභාව ඇතුළට ගෙනල්ලා මේකට විරෝධතාවය පළ කරලා සභාපතිවරයා විදියට ගනිපු ඉදිරි පියවර ආපස්සට යොමු කරමින් ඉතාමත් නිවැරදි, නිර්භීත මැදිහත්වීමක් කරා. ඒ සම්බන්ධව ඔබතුමාටත් ස්තූතිය හිමිවෙනවා මේ සභාවේ. ඇත්තටම මේකේ ඉතිහාසය අපි කතා කරලා තියෙනවා. මේකේ වටිනාකමත් අපි කතා කරලා තියෙනවා. මේ මුළු රටක්ම දන්න සිද්ධියක්. දැන් ඒ සිද්ධිය නැවත ආපස්සට හරවලා නිවැරදි කිරීමේ වගකීම සභාවෙන් එහාට ගිහින් තියෙන කාරණයක් නිසාම අපිට තියෙන්නේ සභාවක් හැටියට මේකට බලපෑම් කරන්න. මේ බලපෑම දිගටම කරලා අත්නොහළ වගකීමක් හැටියට මේක රජයට අත්පත් කර ගන්න ඕන. මේකේ සභාවට යෝජනා කරන්න පුළුවන් දැවැන්ත කර්මාන්ත පුරයකට හෝ වෙනත් කර්මාන්තයකට. ඒ ප්‍රදේශයට වඩා දියුණු ආර්ථික ක්‍රමවේදයක් උපයෝගි කර ගන්න පුළුවන් වත්කමක් මේක. සම්පතක්. ඒ නිසා මේ සභාවේ මේ යෝජනාව ස්ථිර කරන අතරම අපි යෝජනා කරනවා මේ කාරණයට මැදිහත් වෙච්ච, මේක ආපස්සට හරවන්න, මේක අන්සතු කරන්න මැදිහත් වෙච්ච අයට දැන් ඔබතුමාලට පහසු වේවි මේ සම්බන්ධව මැදිහත් වෙන්න. මේක ක්‍රියාවට නඟපු පුද්ගලයෝ, ඒ අයත් දැන් ඔබතුමාලා එක්ක ඉන්න නිසාම මේක තෝරා බේරා ගන්න පහසුයි මේක වුණේ කොහොමද කියලා. මේ යෝජනාව ස්ථිර කරමින් බලකරනවා මේ බලප්‍රදේශයට අයිති වටිනා සම්පත නැවත ජනසතු කරන්න. මිනිස්සුන්ට, ඒ ප්‍රදේශයේ ජනතාවට ප්‍රයෝජනයක් වන පරිදි, සභාවට වටිනාකමක් ඇති වන පරිදි වහාම හැකි ඉක්මනින් පවරා ගෙන ජනතාවට ඒකෙ වරප්‍රසාද, වටිනාකම ජනතාවට එකතු කරන්න කියලා මම යෝජනා කරනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, මේ සටනේ ඇත්තටම විස්තර කරගෙන යන්න ඕන නැහැ. ඒක කරලා තියෙනවා. මේ සටනේ මුල ඉඳලම මම බොහොම

පැහැදිලිවම ඉන්නවා. ඒ විතරක් නෙමෙයි මේකෙදි විශේෂ ස්තුතියක් කරන්න ඕන. මේ වගේ දේවල් අද කෙරෙන කොට මේ සටනේ නායකත්වය ගන්න ඕන අපි. මොකද විරුද්ධ පක්ෂය තමයි නිතරම යන්නේ. සන්තෝෂ වෙනවා ආණ්ඩු පක්ෂයේම මන්ත්‍රීවරුන් වන විශේෂයෙන්ම ලියනගේ මන්ත්‍රීතුමා, සුගත් මන්ත්‍රීතුමා ඇතුළුව අපේ ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීවරු දැඩි සහයෝගයක් දෙමින් ක්‍රියාකිරීම පිළිබඳව විශේෂ ස්තුතියක් පිරිනමනවා. අද වෙනකොට ඉතාම පැහැදිලිව මේ සභාවේ විරුද්ධ කෙනෙක් නැහැ බොහොම පැහැදිලිවම. එක දෙයක් අමතක වෙන නිසා මම ඒක මතක් කරනවා. අද වෙනකොට මේ සටන අඛණ්ඩව ගෙනියන්න ඕන නිසා ගතිපු ක්‍රියාමාර්ග තොගයක් තියෙනවා. හැම සතියෙම දවස් තුන හතරක් හම්බ වෙනවා. අපේ ගරු සභාපතිතුමත් සහභාගි වෙනවා. ඒ සියලු දෙනා සහභාගි වෙමින් කණ්ඩායමක් විදියට වැඩ කරගෙන යනවා. අද වෙන කොට ආර්ථිකය බොහොම අමාරු තත්ත්වයකට ගිහින් තියෙනවා. මෙම කමිටුවේ භාණ්ඩාගාරිකතුමා විදියට ඉන්නේ රත්න ගමගේ මැතිතුමා. අද වෙන කොට සල්ලි බින්දුවට ගිහින් තියෙනවා. හැබැයි මේ සටන අතහරින්න පුළුවන්කමකුත් නැහැ. ඒ හින්දා අපි පහුගිය දවස්වල සාකච්ඡාවක් කරා. අපිට කීයක් හරි දීමනාව දෙනවා නම් සියලු මන්ත්‍රීවරු මේකට පොඩි පරිත්‍යාගයක් කරන්න. මොකද එන්න බැරිවෙන කට්ටිය ඉන්නවා. හැමෝටම යම් යම් ප්‍රශ්න තියෙන්න පුළුවන්. ඒ පරිත්‍යාගය අද දවසේ අමතක නොකර කරලා යන්න කියලා ඉල්ලා සිටිනවා. ඒක සුගත් මන්ත්‍රීතුමාට හරි ලියනගේ මන්ත්‍රීතුමාට හරි ලැබෙන්න සලස්සවන්න. නැත්නම් ඉන්දික මන්ත්‍රීතුමාට දෙන්න. ඒක භාණ්ඩාගාරිකතුමාට ලබා දේවි.

ඊළඟට ගරු සභාපතිතුමනි, ඔබතුමාට දීලා තියෙනවා කොන්දේසි නැතුව මේ පිළිබඳව මොන ආකාරයෙන් ප්‍රශ්නයක් ආවත්, නන්දිමිත්‍ර විද්‍යාලයේ ප්‍රශ්නය මොන විදියකින් ආවත් සභාවක් විදියට ඔබතුමාට මොන විදියකින් හරි හිරිහැරයක් වෙන්න අපි ඉඩ තියන්නේ නැහැ. සර්වාජ් බැරිනම් මොනවා ආවත් ඔබතුමා කෙළින් ඉන්න. අපි ඔබතුමා සමඟ ඉන්නවා. ඇත්තටම කොන්දේසි නැතුව අපි සියලු දෙනාම බැඳිලා ඉන්නවා ආරක්ෂා කරන්න. මේ යෝජනාව ඉතාම කාලෝචිතයි. ඉදිරි ක්‍රියාමාර්ග වල්දි ඉල්ලා සිටිනවා මොන ක්‍රමයෙන් හරි ඉඩකඩ හදාගෙන අපි කරාපිටියේ කරා. ගාල්ලේ කරා. අපේ කට්ටියගේ සහභාගීත්වය බැලුවම මන්ත්‍රීවරු විදියට පොඩි අඩුවක් තියෙනවා. ඒ හින්දා සියලු දෙනාම ආ හැකි විදියට සහභාගි වෙන්න. එතකොට තමයි ඒ හයිය එන්නේ. මම මේ අවස්ථාවේම ඉල්ලා සිටිනවා. ඒ වැඩසටහන ගැන ඔබතුමාම විස්තර කරලා කියන්න. පස්සේ හරි මේ එක්කම හරි කියන්න. ලබන සතියේ දා ගතිපු වැඩසටහන ගැනත් කියන්න. ඒක වටිනවා.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා ඒ සම්බන්ධව මන්ත්‍රීවරු විදියට සියලු දෙනාගේ සහය ලැබෙනවා. අපි අනිවාර්යයෙන්ම ඔවුන් සමඟ හිට ගන්නවා. මේක විශේෂයෙන්ම සභාගත වෙන්න ඕන. ඒකෙදි ඔබතුමාට යම්කිසි බලපෑමක් හෝ කිසියම් දඩ මුදලක් ඉල්ලලා නඩුවක් දැම්මොත්, යම්කිසි ප්‍රශ්නයක් ආවොත් අපි සියලු දෙනාම ඒ වෙනුවෙන් පෙනී ඉන්නවා. ඒක නිසා ඔබතුමා නිර්භයව සභාපතිතුමා විදියට ගන්නා ඒ තීන්දු ගන්න. ඒ ආයතනය පවරා ගැනීමට අවශ්‍ය කටයුතු ඔබතුමාගේ පැත්තෙන් උපරිමව කරන්න. මන්ත්‍රීවරු සියලු දෙනා පක්ෂ පාට භේදයක් නැතුව මේ සටනේ ඉන්නවා. ඔවුන්ට තිබෙන්නා වූ අවිවේකි තත්ත්වයන්, පැවරී තිබෙන රාජකාරි තත්ත්වයන් උඩ සහභාගි වීමට නොහැකි වුණත් ඔවුන් හදවතින් මේ කටයුත්තේ ඉන්නවා කියන එක මට විශ්වාසයෙන් කියන්න පුළුවන්. ඒ වගේම තමයි අපේ බෝපෙ පෝද්දල බල ප්‍රදේශයේ තියෙන සුවිශේෂීම වටිනාකමක් ඇති, විශාල වටිනාකමක් තියෙන භූමියක් මේක. අක්කර 17 ක් එක තැනක තියෙන තැනක් මේ. ඉස්සර තුනී ලෑලි සංයුක්ත මණ්ඩලය පවත්වාගෙන යන කාලේ රාජකාරිය කොටස් තුනකට ගියා. දස දහස් ගණන් සේවක පිරිසක් ඒකේ සේවය කරා. ඒ කර්මාන්තයම පිහිටෙව්වොත් එතන බෝපෙ පෝද්දල බලප්‍රදේශයේ ඉන්න මහජන නියෝජිතයෝ වශයෙන් කටයුතු කරන්නේ අපි. පත්වෙන්න ඉන්න අයට හෝ පක්ෂ පාට භේදයකින් තොරව ඒ රැකියා අවස්ථා ලබා දෙන්න පුළුවන් මහගු වටිනාකමක් තිබෙන ස්ථානයක් ඒක. ඒ නිසා මම පළමුවෙන්ම ස්තුතිවන්ත වෙනවා සුගත් මන්ත්‍රීතුමාටත්, ගයාන් මන්ත්‍රීතුමා ඇතුළු ඒ සම්බන්ධව කටයුතු කරන සියලු දෙනාට. ජනතා විමුක්ති පෙරමුණත් මහා විශාල කාර්යභාරයක් කරනවා. සම්මු ආරියවංශ මැතිතුමා, ඒ වගේම මාධ්‍ය වලිනුත් අපිට විශාල පිටුවහලක් ලබා දෙනවා. ප්‍රවාහන පහසුකම් නැත්නම් මාධ්‍යයට අපිට හරි කතා කරන්න අපි එක්කන් යන්නම්. මෙතන මේ වාර්තාව පොඩ්ඩක් හෝ ලබා ගන්න ඕන කියන උත්සාහය ඒ අයගේ පැත්තෙන් තියෙනවා. මේ වෙනුවෙන් කැපවෙන සියලු දෙනා වෙනුවෙන් මන්ත්‍රීවරු විදියට පෙනී ඉන්නවා කියන පොරොන්දුව ලබා දෙනවා. ඔබතුමා ඒ සම්බන්ධව දැඩි තීන්දුවක ඉන්න. මන්ත්‍රීවරු එක්ක අපි මේ සටන ජයග්‍රහණය කරමු. සටන අරන් යමු කියන ආරාධනය කරමින් මම නිහඬ වෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එතනදී දැනට ගරු ජනාධිපතිතුමාට ඒ පිළිබඳව ලිපි යවලා තියෙනවා. ඒ වගේම පහුගිය පැවතුණු ගාල්ල සම්බන්ධීකරණ කමිටුවේදීත් මම යෝජනාවක් කරා සම්බන්ධීකරණ කමිටු යෝජනාවක් විදියට නැවත පවරා ගැනීමට යෝජනා කරලා ජනාධිපතිතුමාට දන්වා යවන්න. ඒ වගේම මම මේ ප්‍රාදේශීය සභාවේ එකඟතාවය නැතුව කිසිසේත්ම

මම සභාපතිධූරයේ ඉන්නකම් මම මේ ඉඩමට මගේ අනුමැතිය ලබා දෙන්නේ නැහැ. මම කියන්නේ ස්ථිර කතාවක්. සියලු මන්ත්‍රීතුමන්ලාගේ, මන්ත්‍රීතුමියන්ලාගේ එකගතාවයකින් තොරව. එහෙම එකගතාවන් ගන්න වෙලාවක් එන්න පුළුවන්. නමුත් මම ඉතාමත් වගකීමෙන් කියනවා ඒකට මගේ පෑන පාවිච්චි කරන්නේ නැහැ අනුමැතියක් ලබා දෙන්න. ඒක මේ අවස්ථාවේදී වගකීමෙන් ප්‍රකාශ කරනවා.

ඊළඟට අනිත් කාරණය තමයි යම් හෙයකින් නීතිමය තත්ත්වයකට ගියොත් ඒකෙන් ලැබෙන ප්‍රතිඵලය අපිට අහිතකර වුණොත් ඒකේ යම් ගෙවීමක් කරන්න වුණොත් සභාව විසින් දරන්න ඕන කියන එක මම ප්‍රකාශ කරනවා. පුද්ගලිකව මට ගෙවන්න මුදල් නැහැ. ඒකට සභාව විදියට ඒ වගකීම දරන්න ඕන කියන ප්‍රකාශය මම මේ අවස්ථාවේදී කරනවා. ඒක කලින් යෝජනාව ස්ථිර වෙච්ච කාරණයක්. ඒක හින්දා ඒ යෝජනාව ස්ථිර කිරීමකට යන්න ඕන නැහැ.

ඇත්තටම සුගත් කලංසූරිය මන්ත්‍රීතුමත්, ගයාන් ගීතික ලියනගේ මන්ත්‍රීතුමත් මේ වෙනුවෙන් පෙනී සිටීම පිළිබඳව දීර්ඝ කාලයක් තිස්සේ ඉඳන් ස්තුතිවන්ත වෙනවා. මොකද ඒක එතුමන්ලාගේ ශක්තිය, එතුමන්ලාගේ හයිය. නමුත් මම එවෙලේ ගත්තේ සැලසුම් කමිටුව විසින්, නාගරික සංවර්ධන අධිකාරියේ එකගතාවයට අනුව තියෙන කොන්දේසි වලට යටත්ව ගන්න ඕන තීරණය. ඒ වගේම ඒ විරෝධතාවය නිසා ඒ තීරණය මම හකුළාගෙන වෙනස් කරගෙන තියෙනවා. ඒකෙදී මම කළිනුත් කිවුවා වගේ නීත්‍යානුකූල තත්ත්වයකට ආවොත් ඒ පිළිබඳව සභාව මැදිහත් වෙන්න කියන එක මේ අවස්ථාවේ ඉල්ලා සිටිනවා.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ః-** ගරු සභාපතිතුමනි, සභාපතිවරයා හැටියට ඔබතුමාගේ ආරක්ෂාව වෙනුවෙන් තමයි මේ යෝජනාව පැහැදිලිවම ගෙනාවේ. නැත්නම් අපි යෝජනා ගෙනල්ලා තියෙනවානේ දිගටම. ඒ කියන්නේ සභාවක් හැටියට පෙනී ඉන්නවා කියන එක පැහැදිලිවම කියනවා. අනිත් එක මම පොඩ්ඩක් මේකේ නීතිය පැත්තත් හොයාගෙන ආවා. අපි දැන් සභාව විතරක් නෙමෙයි බෝපෙ පෝද්දල ජනතාව, බෝපෙ පෝද්දල විහාරස්ථාන සියල්ලම ඒ වගේම අවට විහාරස්ථානවල නායක ස්වාමීන්වහන්සේලා වැනි ජාලයක් වගේම රත්ගම, ගාල්ල ප්‍රදේශවල සියලු අය අපි එක්ක අත්වැල් බැඳගෙන ඉන්නවා. සභාපතිතුමනි මේක මොන ජනාධිපතිතුමා කරත් වංචා සහගත ගනුදෙනුවක්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ః-** ඒක වෙන කතාවක්.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ః-** ඒක හින්දා පුරවැසියෙක් විදියට අපිට අයිතියක් තියෙනවා. අපි ඒ අරමුණට පුරවැසියන් හැටියට, ප්‍රදේශයේ පදිංචිකරුවන් හැටියට අපිට අයිතියක් තියෙනවා මේ වෙනුවෙන් පෙනී සිටින්න. අපිට අධිකරණයට යන්නත් අයිතියක් තියෙනවා. මම හිතන්නේ නැහැ අධිකරණයට ගියත් නීතියෙන් අපිව වැරදිකරුවෝ වෙයි කියලා. අපිට කොට්ඨාශයේ පුරවැසියන් හැටියට අධිකරණයට යෑමට අයිතියක් තියෙනවා. ගිංතොට සිද්ධිය ගැන කතා කරා ඇති අපි සභාවක් හැටියට ඒ යෝජනාව ගත්තේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ః-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ః- 06.** බෝපෙ පෝද්දල බල ප්‍රදේශය තුළ පැවැත්වෙන පෞද්ගලික උපකාරක පන්ති පිළිබඳව වාර්තාවක් සැකසීමටත්, සියලුම පෞද්ගලික උපකාරක පන්ති සභාව තුළ ලියාපදිංචි කිරීමටත්, පෝය දින හා ඉරිදා දින පන්ති නොපවත්වන ලෙස ඉල්ලා සිටීමටත් යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ః-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ః-** ඒකට මන්ත්‍රීතුමා ප්‍රතිපත්තියක් එන්න ඕන. මම දැක්කා මහින්ද රාජපක්ෂ ගරු අගමැතිතුමා සමගත් ගිහිල්ලා ස්වාමීන් වහන්සේලා මේ ගැන සාකච්ඡා කරනවා. ඒක අපිට සභාවක් හැටියට ගන්න පුළුවන් තීන්දුවක් නෙමෙයි. මමත් කැමතියි ඒක සභාවක් විදියට ගන්න පුළුවන් නම් ඒක අපිට සභා මට්ටමින් ගන්න පුළුවන් තීන්දුවක් නෙමෙයි. ඒකට ජාතික ප්‍රතිපත්තියක් හදලා ඒ මට්ටමට එන්න ඕන තීන්දුවක්. ඔබතුමාට යෝජනා කරන්න පුළුවන්. අපිට ඒක නැවැත්වීමට නෙමෙයි අගමැතිතුමාටත්, ජනාධිපතිතුමාටත් සභාවක් විදියට ඉල්ලීමක් කරලා යවන්නත් පුළුවන්.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ః-** පළවෙනි එකේ යෝජනා කරලා තියෙන්නේ මෙහේ තියෙන උපකාරක පන්ති පිළිබඳ වාර්තාවක් හදලා අපිව දැනුවත් කරන්න කියන එක. ඒවා ලියාපදිංචි කරන්න. ගුරුවරුන්ගෙන් මෙහෙම කරන්න කියලා ඉල්ලීමක් කරන්න තමයි මේ යෝජනාවෙන් කරලා තියෙන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ- 07.** අප බල ප්‍රදේශයේ විහාරස්ථානවල ඉල්ලීමක් ලෙස නායක හිමිවරුන්ගේ නිර්දේශ සහිතව ලිපියක් සකසා ඉරිදා දින හා පෝය දින උපකාරක පන්ති නොපැවැත්වීම නීතිගත කරන ලෙස අතිගරු ජනාධිපතිතුමාගෙන් හා අගමැතිතුමාගෙන් ඉල්ලා යැවීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** අපිට ඉල්ලන්න අයිතියක් තියෙනවා. ඒගොල්ලෝ ක්‍රියාත්මක කරයි. අපි පළමුව මෙහේ ටියුෂන් කරන ගුරුවරුන්ගෙන් ඉල්ලීමක් කරමු.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ- 08.** බෝගහවේල්ල මාර්ගයේ පැති මාර්ගය වාහනයක් අයින්කළ හැකි ආකාරයට සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** මේ පාර කාපට් කරන්න දාලා තියෙනවා. එතකොට මේ කොටසත් එක්කම කරන්න පුළුවන්. මේ යෝජනාව ගෙනාවට පස්සේ තමයි කාපට් කරන එක ආවේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ- 09.** කරාපිටිය සන්සයිඩ් ගාර්ඩන් ඉඩමේ මාර්ගය මිනින්දෝරු මැනුමක් සිදුකර අනවසර තාප්ප ඉවත්කර ජලය බැසයාමට කාණු පද්ධතියක් ඉදිකිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** මිනින්දෝරු මහතෙකු ලවා මේක මැනුමක් සිදු කරන්න ඕන. දීර්ඝකාලීන ගැටලුවක් තියෙන එකක් මේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ- 10.** ගල්කැටිය, සරත් මහතාගේ නිවසට යන මාර්ගයේ ඉතිරි කොටස සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ- 11.** දීර්ඝකාලීන ගැටලුවක්ව පවතින පන්විලදූව වත්ත කාණු පද්ධතිය ඉදි කිරීමට බෝපෙ පෝද්දල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට මුදල් ලැබී තිබුණද, නිවැරදිව කාණු පද්ධතිය ඉදිකරනු ලබන දිශාව හා කළ යුතු ආකාරය පිළිබඳව සැලැස්මක් අනුමතකොට ප්‍රාදේශීය ලේකම්තුමියට ඉදිරිපත් කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

මේක 2016 ඉඳලා ආපු සිද්ධියක්. ඊට පස්සේ පහුගිය වකවානුව තුළ මේකේ තාප්පය බැඳලා නැති ඉඩම තිබුණ නිසා ජලය බැස ගියා. මේ සිද්ධිය යන අතරෙම සභාව මේ ඉඩම අනුමත කරලා දුන්නා. වෛද්‍යවරයෙක් අරගෙන තියෙනවා. අඟල් 08 ක වගේ බටයකින් උඩ ඉඳලා එන වතුර ටික බැහැලා ගියා. ඊට පස්සේ ඒ මනුස්සයා කාණුව දානවා කියලා ඒ බටත් ගලවලා පැත්තකට දැම්මා. දැන් ටැංකියක් වගේ උඩ ප්‍රදේශය පිරෙනවා. ඉතිං ඒකට සැලසුම හදලා ඉදිරිපත් කරන්න. මේ ගැටලුව යන අතරේ තමයි නිවසේ සැලැස්ම අනුමත වෙන්නේ. බටෙන් වතුර බහින එක හරි තියෙන්න ඇරියානම් ඉවරයිනේ. අඩි 08 ක් විතර වතුර පිරෙනවා උඩ ටිකේ. ඒක කඩිනමින් ලබා දෙන්න. මුදල් ඇවිල්ලා තියෙනවා. පටන් ගන්න දැන් තියෙන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

<u>**ගරු මන්ත්‍රී සුගත් කළංසූරිය මැතිතුමාගේ යෝජනා**</u>

**ගරු මන්ත්‍රී සුගත් කළංසූරිය මැතිතුමා ඃ- 12.** පියදිගම, බබල්ලැන්ඩ් ඉඩම වෙන්දේසි කිරීමේදි ප්‍රදේශීය සභාවට අංක 10 හා 13 යන ඉඩම් කැබලි දෙක ලබා දී ඇති බව සඳහන් වේ. නමුත් මේ වන විට එම ඉඩම් කැබලි දෙක වෙනත් පාර්ශවයකට විකුණා හෝ වෙනත් ආකාරයකට ලබාදී ඇති බව පෙනී යයි. මේ පිළිබඳව පරීක්ෂණයක් සිදු කිරීමටත්, ඒ අනුව සුදුසු ඉදිරි නීතිමය ක්‍රියාමාර්ග ගන්නා ලෙසත් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට හා අල්ලස් හා දූෂණ විමර්ශන කොමිෂන් සභාව වෙත දන්වා යැවීමටත්, මෙම වංචාව පිළිබඳව පරීක්ෂණයක් සිදුකර වාර්තාවක් ලබා දෙන ලෙසත් යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී සුගත් කළංසූරිය මැතිතුමා ඃ- 13.** වටරැක නැගෙනහිර, ඇලබඩ පාලම අසල සන්බීම් පාර්ක් ඉඩමේ පහල කොටසේ ඇති මාර්ගය කොරිපස් යොදා සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී සුගත් කළංසූරිය මැතිතුමා ඃ- 14.** වැලිපිටිමෝදර කොට්ඨාශයේ, වැලිපිටිමෝදර ග්‍රාම සේවා වසම, පියදිගම ග්‍රාම සේවා වසම තුළ ඇති ජලය බැසයන ඇළවේලි හා කාණු අවහිර වී ඇති බැවින් එක්ස්කැවේටර් යන්ත්‍රයක් යොදා එම අවහිරතා ඉවත්කර දෙන මෙන් යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී කේ.යූ.ජී. යසරත්න මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී සුගත් කළංසූරිය මැතිතුමා ඃ- 15.** ගිංතොට, අඹගහවත්ත, දැඩැල්ලගොඩ ගමට යන පාරේ පැති බැම්මක් ඉදිකිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී සුගත් කළංසූරිය මැතිතුමා ඃ-** ඒවගේම ගරු සභාපතිතුමා තව එක කාරණයක් තියෙනවා. ඒකත් මම මේ අවස්ථාවේ සඳහන් කරනවා. වැලිපිටිමෝදර ආරච්චිගොඩ වත්ත ප්‍රදේශයේ අපි බෝක්කුවක් දැම්මා ඒකට. අලුතෙන් දාපු එක කැඩිලා තියෙනවා. ඒකට නැවත වතාවක් ඒ බෝක්කුව අයින් කරලා දාන්න ඕන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දැන් මෙහෙම ගැටලුවක් තියෙන්නේ. අපි රජයේ ආයතනයකින් කියලා පුහුල්දූවෙන් තමයි සිලින්ඩර් ගේන්නේ. නමුත් දැන් පුහුල්දූවෙන් ගෙනල්ලා දාපු සිලින්ඩර් දෙකම කැඩුණා. මහා ලොකු ගැටලුවක් මේක. මට තේරෙන්නේ නෑ මොකද කියලා. රිපෝට් කරා. රිපෝට් කරලා තව එකක් ආවා. ඒකත් කැඩුණා. ඒ අය දෙන්න බැහැයි කිය කිය ඉඳලා ලේකම්තුමා කතා කරාම දුන්නා එකක්. ඒ ගෙනල්ලා දාපු එකත් කැඩුණා.

**ගරු මන්ත්‍රී සුගත් කළංසූරිය මැතිතුමා ඃ-** ප්‍රමිතිය බාල එකක් තියෙන්නේ. දැන් මෙතන සභාපතිතුමා අපිට ප්‍රශ්නයක් තියෙනවා තිබ්ච්ච බෝක්කුවත් නෑ මිනිස්සුන්ට. දැන් යන්න බෝක්කුවක් ඇත්තෙම නෑ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** සිලින්ඩරය වැහෙන්න අඩි 02 ක් පස් දාන්න ඕන. එහෙම නොකරම තමයි ඔහොම කැඩෙන්නේ.

**ගරු මන්ත්‍රී සුගත් කළංසූරිය මැතිතුමා ඃ-** දැන් මේ කාරණයට මොකක්හරි කරලා දෙන්න ඕන. තිබුණ තත්ත්වයෙන් තිබුණා නම් ගැටළුවක් නෑ. ඉදිරි මැතිවරණ කාලයේදී ඒ පැත්තට යන්න හම්බ වෙන්නේ නෑ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒකත් මාරු කිරීමට ලක් කරලා පස් දාන්න වෙයි අඩියක් දෙකක්.

**ගරු මන්ත්‍රී සුගත් කළංසූරිය මැතිතුමා ඃ-** අපි ඕක ගැන කතාකරන කොට වටරැක පස් කන්දක් තියෙනවා කිවුවනේ කපන්න. ඒකෙන් පස් ට්‍රැක්ටර් ලෝඩ් 04 ක් විතර දැම්මා නම් ඇති. එතකොට ඒ වැඩෙත් කෙරෙනවා. පස් ටික එතනට දාලා සිලින්ඩරෙත් දාලා දෙන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** තාක්ෂණ නිලධාරී යවලා ඒක පරික්ෂා කරලා ඒකට උත්තරයක් දෙන්නම්. කරලා දෙන්නම් ඒක.

**ගරු මන්ත්‍රී සුගත් කළංසූරිය මැතිතුමා ඃ-** ඒක අද හෙටම කරලා දෙන්න. ඒක විශේෂයි.

ඊළඟට අර වැලිපිටිමෝදර බටයක් අයින් කරන්න කියලා තියෙනවා. ඒ බටය තාම තියෙනවා. ඊයේ පෙරේදා අබේසේකර මන්ත්‍රීතුමයි, ලියනගේ මන්ත්‍රීතුමයි අපි තුන්දෙනාම ගියා බේරෙන්න බැරි කමට. තාමත් ඒ බටයෙන් කාණුවට ජරා වතුර එනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කොතනද තැන.

**ගරු මන්ත්‍රී සුගත් කළංසූරිය මැතිතුමා ඃ-** ගිංතොට වැලිපිටිමෝදර පන්සලට යන පාරට මෙහා පාර. දිල්හානි කියලා එක්කෙනෙක් එන්නේ. ඒක මට ගිහින් අස්කරන්න බෑනේ. එක්කෝ සභාවෙන් ගිහින් අස්කරන්න ඕන. පාර හරහා බටය එවලා තියෙන්නේ. ගෙදර එහා පැත්තේ තියෙන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක අයින් කරන්නම්. ඒ ගියපු තුන්දෙනා දැක්කේ නැද්ද දිල්හානිත් එළියට වතුර බට දාලා තියෙනවා තුන් පලකින්. මම කියන්නේ සාධාරණය. අර මනුස්සයා පාර හරහා කඩලා බටයක් දාපු එකෙත් වැරැද්දක් තියෙනවා. ඒ පාර හරහා කඩපු එක. දාලා දැන් පාර වහලා තියෙනවා. එහා පැත්තේ කාණුව තියෙන්නේ. දිල්හානි තියන කෙනා තුන් තැනකින් තමන්ගේ කුණු වතුර ටික පාරට දානවා. ඒ වැඩ දෙකම වැරදියි.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** ඒ දෙකටම නීතිමය ක්‍රියාමාර්ග ගන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අර වැරැද්ද නිවැරදි කරන්නම්.

**ගරු මන්ත්‍රී සුගත් කළංසූරිය මැතිතුමා ඃ-** වැරදි නම් ඒකත් අයින් කරන්න. කාණුව සුද්ධ කරන්නකෝ. මේ දෙකම අයින් කරන්නකෝ. සභාපතිතුමා දන්නවා ඔබතුමා ගාවටත් ඇවිල්ලා කියලා කරදර කරනවා. මේ ප්‍රශ්නය දිගින් දිගටම තියා ගන්න බැහැනේ.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා ඔබතුමා මෙතන මතුවෙච්ච කාරණයක් සම්බන්ධව අදාළ තාක්ෂණ නිලධාරිනිය යැවුවා ඒ පරීක්ෂා කටයුතු කරලා එන්න කියලා. එතුමිය පැමිණිය නිසා මොකක්ද දන්නේ නෑ ඒකේ තත්ත්වය.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ ගැන සභාව දැනුවත් කිරීම සඳහා කාරක සභා අවස්ථාවක් මම යෝජනා කරනවා.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

<u>කාරක සභා අවස්ථාව</u>

කාරක සභා අවස්ථාවේදී තාක්ෂණ නිලධාරිණී අයි. ඩී. කමණී චන්ද්‍රලතා මිය පහත අදහස් දක්වන ලදී.

- එම අනවසර ඉදිකිරීම සිදු කරන පුද්ගලයාගේ නම නිශාන්ත ජාගොඩ බවත්, පදිංචිය මාම්පිටිය, ඉසුරු පෙදෙසේ බව.
- එම පුද්ගලයා එම භූමියෙන් අක්කර එකයි කාලක් මිලට ගෙන ඇති බවට දැනුවත් කළ බව.
- මිරිදිය මසුන් ඇති කිරීමට හා සංචාරක ව්‍යාපාරයට මෙම ඉදිකිරීම් කටයුතු සිදු කරන බව.
- එම භූමියේ සංවර්ධන කටයුතු සිදු කිරීම සඳහා සභාවෙන් අනුමැතිය ලබා ගෙන නොමැති බැවින් එම අනවසර ඉදිකිරීම් කටයුතු නැවැත්වීම සඳහා ටෙලිග්‍රෑම් එකක් මගින් දැනුම් දෙන බව.
- ඒ ආසන්නයේ ඇති අනෙක් ඉඩමේද සංවර්ධන කටයුතු සිදු කර ඇති බවත්, එම පුද්ගලයාගේ පදිංචිය වක්වැල්ල පුහුණු මධ්‍යස්ථානය අසළ බව.

මීට අමතරව මන්ත්‍රීවරුන්ට මෙම අනවසර ඉදිකිරීම සම්බන්ධව ඇති ගැටලු සාකච්ඡා කරන ලදී.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කාරක සභා අවස්ථාව අවසන් කිරීම සඳහා මම යෝජනා කරනවා

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

<u>**ගරු මන්ත්‍රී එම්.එන්.එච්. කියාස් මැතිතුමාගේ යෝජනා**</u>

**ගරු මන්ත්‍රී එම්.එන්.එච්. කියාස් මැතිතුමා ඃ- 16.** ගිංතොට තුනී ලැලි සංස්ථාවේ කුරුඳුවත්ත කොට්ඨාශයට අයත් ප්‍රදේශයේ තාප්පය කෙළවරින් ගිංගඟ දක්වා අඩි තුනක කාණුවක් කැපීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී එම්.එන්.එච්. කියාස් මැතිතුමා ඃ-** එතන කාණුවක් තිබුන තැනක්. අවුරුදු ගාණක් තිස්සේ තිබුන කාණුවක්. කුරුඳුවත්ත පාරේ පිනැන්ස් වත්ත, ඉසුරු උයන ප්‍රදේශවල වතුර බහින්නේ ඒ කාණුව දිගේ. ඒ කාණුව දැන් වැහිලා තියෙන්නේ. දැන් අපිට ඒ ඉඩමේ ප්‍රශ්නයක් වෙන්නේ නැහැ. ඒ ප්ලෑන් එකේ තියෙන කාණුවක් ඒක. අපිට සභාවේ බැකෝ එක දාලා ඒ කාණුව කපලා දෙන්න. එතන ආර්.ඩී.ඒ පාර. නමුත් වැස්ස ආපු ගමන් අඩි දෙකක් තුනක් යටවෙනවා. අඩි තුනක් පළලට කාණුව කපන්න කියන්න. එතනට ගියාම ඒක පේනවා. තාප්පය කෙළවරින් කාණුව තියෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** පාර මතුවෙන්නේ නැද්ද.

**ගරු මන්ත්‍රී එම්.එන්.එච්. කියාස් මැතිතුමා ඃ-** පාරෙන් තමයි ගඟට බහින්නේ ප්ලයිවුඩ් එකේ අයින දිගේ.

**ගරු මන්ත්‍රී යූ.එල්. තුසිත චාමින්ද මැතිතුමා ඃ-** එතන තට්ටු දෙකේ ගෙයක් හදලා තියෙනවා නේද

**ගරු මන්ත්‍රී එම්.එන්.එච්. කියාස් මැතිතුමා ඃ-** ප්ලයිවුඩ් එකේ තාප්පය ඇතුලෙන් කාණුව තියෙන්නේ.

**ගරු මන්ත්‍රී යූ.එල්. තුසිත චාමින්ද මැතිතුමා ඃ-** අරහෙන් ගන්න බැරිද

**ගරු මන්ත්‍රී එම්.එන්.එච්. කියාස් මැතිතුමා ඃ-** අරහෙන් ගන්න බැහැ. ප්ලයිවුඩ් එකේ තාප්පය ඇතුලෙන් තියෙන්නේ කාණුව. එහෙන් ගන්න බැහැ. එහෙන් තිබුණේ නැහැ. ප්ලයිවුඩ් එකේ ඇතුලෙන් ගඟට යන්නේ කාණුව. ඒක ලොකු පළල කාණුවක්. සුගත් මන්ත්‍රීතුමා දන්නවා. වැසි දවසට යන්න බැහැ පාරේ. යටවෙනවා එතන. එතන ගිහින් බැලුවම කාණුව තියෙන එක පේනවා. ඒක මතුකරලා දෙන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක තාක්ෂණ නිලධාරී බලලා වාර්තාවක් දෙන්න.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

<u>**ගරු මන්ත්‍රී ජේ.ඒ.චන්ද්‍රකුමාර මැතිතුමාගේ යෝජනා**</u>

**ගරු මන්ත්‍රී ජේ.ඒ.චන්ද්‍රකුමාර මැතිතුමා ඃ- 17.** පුවක්වත්ත, මොහොමඩ් හාසිම් මහතාගේ නිවස අසල මාර්ගයේ ඉතිරි කොටස කොන්ක්‍රීට් කිරීමට හා මාර්ගයේ එම කොටසට සුදුසු පරිදි කාණුවක් යොදා සංවර්ධනය කර පෙට්ටි බෝක්කුවක් ඉදිකිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී ජේ.ඒ.චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** එතන තාක්ෂණ නිලධාරීතුමිය දන්නවා. ගැටලු කීපයක් තියෙන ස්ථානයක් එතන. ඒ ස්ථානයේ මාර්ගයේ ඉතිරි කොටස කොන්ක්‍රීට් කළ යුතුයි. කාණුව මාර්ගය අයිනෙන් යොදවන්න ඕන. විශාල ජල බැස්මක් එන ස්ථානයක් වන නිසා සුදුසු විදියට පෙට්ටි බෝක්කුවක් ඉදිකරන්න තමයි යෝජනා කරේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ජේ.ඒ.චන්ද්‍රකුමාර මැතිතුමා ඃ- 18.** තුංහිරිපාන, පිහිඹිය ගහ, මුලන වත්ත මාර්ගය කොන්ක්‍රීට් කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ජේ.ඒ.චන්ද්‍රකුමාර මැතිතුමා ඃ- 19.** කහඳූව වත්ත හන්දියේ කේ.පී.ෆ්‍රැන්ක් මහතාගේ නිවස ඉදිරිපිට ඇති මාර්ගයට අවහිර කොට්ටම්බා ගස සහා අරමුදලින් කපා ඉවත්කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී ජේ.ඒ.චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, මේක සභා අරමුදලින් කරන්න යෝජනා කරේ. මෙම කොට්ටම්බා ගස ෆ්‍රෑන්ක් මහතාගේ ඉඩම තුළ නෙමෙයි පිහිටලා තියෙන්නේ. මාර්ගය අයිනේ කාණුවට එහා පැත්තේ. දැනට ඒ අයට මේක කපා ඉවත් කර ගැනීමට වත්කමක් නැහැ. සාමාන්‍යයෙන් වට අඩි 05ක විතර ප්‍රමාණයක් තියෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ආර්.ඩී.ඒ එකට අයිති.

**ගරු මන්ත්‍රී ජේ.ඒ.චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** සුදුසු ක්‍රමවේදයක් කරන්න. ආර්.ඩී.ඒ එකට නෙමෙයි අයිති. පාරේ කාණුවෙන් එහා පැත්තේ තියෙන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එහෙම නම් වෙන්දේසි කරමු.

**ගරු මන්ත්‍රී ජේ.ඒ.චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** සුදුසු ක්‍රියාමාර්ගයක් ගන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ජේ.ඒ.චන්ද්‍රකුමාර මැතිතුමා ඃ- 20.** රත්තගිරිවත්ත, පැලවත්ත සුසාන භූමියේ පිහිටා ඇති අවට නිවාස වලට අනතුරුදායක පුළුන් ගස සහා අරමුදලින් කපා ඉවත්කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී ජේ.ඒ.චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** ඒ පුළුන් ගස විශාල වශයෙන් අතු පැතිරිලා අවට ගෙවල් තුනක් අනතුරුදායක විදියට තියෙන්නේ. අපි කවුරුත් දන්නවා පුළුන් කියන්නේ ඒ තරම් ශක්තිමත් ලීයක් නෙමෙයි. බොහෝ ඉක්මණින් ඒකෙන් අනතුරක්වීමට ඉඩ තියෙනවා. මේක පොදු සුසාන භූමියට අයිති ඉඩමේ තමයි පිහිටලා තියෙන්නේ. ඒ නිසා ඒක සභා අරමුදලින්ම කරන්න තමයි කරන්න වෙන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ජේ.ඒ.චන්ද්‍රකුමාර මැතිතුමා ඃ- 21.** පැලවත්ත, අපේගම ප්‍රධාන මාර්ගයේ පැති කාණුව මත කොන්ක්‍රීට් ස්ලැබ් කැලි යෙදීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී ජේ.ඒ.චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** අපේ ගමට හැරෙන තැන එල් හැඩයේ වංගුවක් තියෙනවා. ටී හැඩයට පාර තියෙන්නේ. පුළුල් පාරක හැඩය නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කලින් සභාවක මම යෝජනා කරා. ඒක කෙරුණෙත් නැහැ. ත්‍රීවිල් පාර්ක් එකට හැරෙන තැන.

**ගරු මන්ත්‍රී ජේ.ඒ.චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** ඒකම තමයි මේ යෝජනාව.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කොතනද.

**ගරු මන්ත්‍රී ජේ.ඒ.චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** අපේ ගම පාරේ ත්‍රීවිල් පාර්ක් එකට හැරෙන තැන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ප්‍රධාන පාරෙන් හැරෙන තැනද, ඒකට කළින් සභාවක යෝජනාවක් තියෙනවානේ.

**ගරු මන්ත්‍රී ජේ.ඒ.චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** ඒක ක්‍රියාත්මක කරන්න ක්‍රමවේදයක් බලලා සභාපතිතුමනි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ජේ.ඒ.චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** මහජන සෞඛ්‍ය පරීක්ෂක නිලධාරි මහත්වරුන්ට ඔය කාණු පිළිබඳ ප්‍රශ්න, ගෙවල් වලින් අප ජලය මහා මාර්ග වලට මුදා හැරීම පිළිබඳව දැනුවත් කරාම දුරකථනයෙන්, අපෙන් ඒ අය පැමිණිල්ලක් ලිඛිතව ඉල්ලනවා. මම දන්නේ නෑ ඒ ක්‍රමවේදය මොකක්ද කියලා. එතකොට ඒ මහජන පරීක්ෂක කියන එකේ මහජන කියන කෑල්ල අත හැරලා දාන්න ඕන. මහජනයාට පැමිණිල්ලක් කරන්න ගියාම ලිඛිතව ඉල්ලනවා. මම දන්නේ නැහැ එහෙම නීතියක් තියෙනවාද කියලා. ඒකට කරුණාකරලා ඔබතුමාගේ අවධානය යොමු කරන්න. අපි මන්ත්‍රීවරු වෙලා කරන පැමිණිලිත් අපෙන් ලිඛිතව ඉල්ලනවා. ඒක නිසා ඒ ගැන ක්‍රමවේදයක් අපිවත් දැනුවත් කරලා එතුමන්ලාවත් දැනුවත් කරන්න. දැන් අපිට වෙලා තියෙන්නේ සභා යෝජනාවක් හැටියට ඒවා යෝජනා කරලා මෙහෙන් යවන්න.

<u>**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමාගේ යෝජනා**</u>

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ- 22.** ගාල්ල, කලේගාන, නාගරුක්ඛාරාම මාවතේ යන ලිපිනයේ පදිංචි පී. එච්. හර්ෂ ප්‍රමෝදය යන අය කම්කරුවෙකු වශයෙන් බඳවා ගැනීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ජේ.ඒ.චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** පළවෙනියට එක්කෙනෙක් දැම්මා. එයා නැවතුණා. ඊට පස්සේ ඊළඟ කෙනාගේ නම යෝජනා කරා. එයත් ආවේ නැහැ. දැන් තව එක්කෙනෙක් යෝජනා කරා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මේ අන්තිම එක. මෙයා නාවොත් නාවම තමයි.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** මම එකඟ වෙනවා ඒකට.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ- 23.** කෲ කැබ් රථය හා කැබ් රථය වීදි පහන් නඩත්තු කටයුතු සඳහා සුදුසු පරිදි නවීකරණයන් සිදු කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ජේ.ඒ.චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මොකක්ද ප්‍රශ්නය තියෙන්නේ ඒකේ.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** හොරයිසන් වීව් වල බල්බ් එකක් හදන්න මට කියලා දවස් 15ක් වෙනවා. සභාවේ ලියලා තියෙනවා. ඇහුවම කියන්නේ අර වාහනය කොහේ හරි ගිහිල්ලා. අර උත්සවයට ගිහිල්ලා. මේ උත්සවයට ගිහිල්ලා කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මේ වාහනවල නවීකරණය කරන්න මොනවාද තියෙන්නේ.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** කැබ් එක කැඩිලා හරි මොකක් හරි වෙලානේ තියෙන්නේ. කෲ කැබ් එක නෙමෙයි. අනිත් කැබ් එක.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අනිත් කැබ් එක වීදි පහන් නඩත්තු කටයුතු වලට යන්නේ නැනේ.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** ඒක තමයි යෝජනා කරේ එහෙමවත් කරලා ඒක හරි ගස්සවලා දෙන්න කියලා.

**ගරු මන්ත්‍රී ජේ.ඒ.චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** මෙතුමා කියන්නේ කෲ කැබ් එක නැත්නම් අනිත් කැබ් එකේ ගිහින් හරි ලයිට් හදන්න කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කෲ කැබ් එක කැඩිලා නැනේ.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** මොකක් හරි තියෙන කැබ් එක කැඩිලනේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ කැබ් එක වීදි පහන් නඩත්තු කටයුතු වලට යන්නේ නැහැනේ.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** ඒක හරි හදලා ඒ මිනිස්සුන්ට උත්තරයක් දෙන්නකෝ. අරක ඇහුවම කැඩිලා කියනවා. තව කාට හරි දුන්නා කියනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එහෙම කියන්නේ නැනේ.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** දැන් දවස් 14ක් වෙනවා අර ලයිට් එක කියලා. මොන කැබ් එකකින්වත් කෙරුණේ නැහැ. රෙපෙයාර් එක කෙරුණේ නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමා කියන්න එපැයි.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** ඔබතුමාටත් කිවුවා. දවස් 14ක් වෙනවා ලියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** පොතේ ලියලා තියෙන ඒවා කෙරෙන්නේ නැතේ මන්ත්‍රීතුමා ලේසියකින්. කාගේවත් නැතිකොට ඒවා කෙරෙන්නේ.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** මොන කැබ් එකෙන් හරි අපේ ලයිට් ටික හදලා දෙන්න. එච්චරයි මට කියන්න තියෙන්නේ. සභාපතිතුමාගේ එකෙන් ගිහින් හරි වැඩේ කරලා දෙන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමා කිවුවේ නැහැනේ.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** පොතක් දාලා තියෙන්නේ මොකටද?.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමා කිවුවේ නැනේ. එහෙමනම් මෙහෙම කරන්න මන්ත්‍රීතුමා. පොත් ටිකේ තියෙන ඒවා විතරක් කරමු. මන්ත්‍රීවරු කියන්න එපා.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** කොහොම හරි කමක් නෑ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමා කියනවා පොතේ ලියලා දවස් 14 ක් යනකම් කෙරුනේ නෑ කියලා. ඔබතුමා මට පුද්ගලිකව කියපු දේවල් කරලා තියෙනවා. අසාධාරණ කතා කියන්න එපා. ඔබතුමා මට පුද්ගලිකව කතා කරලා කියනවා කරන්න කියලා. එතකොට කරනවා. ඔබතුමා දැන් මට කියනවා පොතේ ලියලා දවස් 14 ක් වෙනවා කෙරුනේ නෑ කියලා. ඔබතුමා සාධාරණ වෙන්න. එහෙම නම් මන්ත්‍රීවරුන්ගේ ඒවා කියන එක නවත්වලා ඔක්කොම පොතේ ලියලා කරමු.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** ඒ මනුස්සයා ලියලා තියෙනවා පොතේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක තමයි. ඔබතුමා දැන් කියනවා මට දවස් 14 ක් වෙනවා කරලා නෑ කියලා. ඇහුවම කියනවා පොතේ ලියලා කියලා. එහෙම නම් මන්ත්‍රීතුමා කියන්න තිබුණානේ මට. ඔබතුමාට කරගන්න බැරි වුණාම මට චෝදනා එල්ල කරන්න එපා. ඔබතුමා කියනවා නම් මට කියනවානේ. මොනවද තිස්ස මන්ත්‍රීතුමා කියන්නේ.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** ඔබතුමාට එක දවසයි කිවුවේ. ලයිට් අංශයේ සේවකයන්ට කතා කරලා කියලා තියෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කෙරෙන විදියක් තියෙනවානේ මන්ත්‍රීතුමා. අමුතුවෙන් කියන්න දෙයක් නැහැනේ.

**ගරු මන්ත්‍රී එම්.එන්.එච්. කියාස් මැතිතුමා ඃ-** ඉනිමග උස්ස ගෙන ගිහින් හදන්න පුළුවන්. බලප්‍රදේශයේ ළඟනේ. ඒක කරලා දෙන්න.

**ගරු මන්ත්‍රී ජේ.ඒ.චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** එතුමා ජනතාවාදී ඉල්ලීමක් කරන්නේ. කෘෘ කැබ් එකේ බැරිනම් අනෙක් කැබ් එකේ ගිහින් කරලා දෙන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම අහන්නේ ඔය ප්‍රශ්නය නෙමෙයි.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** එහෙම කරලා හරි ගරු සභාපතිතුමා කරලා දෙන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** හැබැයි තිස්ස මන්ත්‍රීතුමා මෙහෙම දෙයක් තියෙනවා. ඔබතුමා කියන කියන ලයිට් 100 ක් විතර හැදුවා. නමුත් පොතේ තියෙන එකක් ගැන ඔබතුමා කතා කරනවා. අසාධාරණයි.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** එහෙම නම් සමාවෙන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම කියන්නේ අසාධාරණයි.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** සමාවෙන්නකෝ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මට හිතෙන්නේ හොඳට කියලා තියෙනවා ඒ මනුස්සයා.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** ඔව්. ලැජ්ජ නැද්ද කියලා ඇහුවා. ඇත්ත කියන්න එපැයි. සභාපතිතුමත් අපේ කිට්ටුව ඉන්නවයි කිවුවේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා** **:- 24.** කෘෘ කැබ් රථයේ වායු සමීකරණ පද්ධතිය අලුත්වැඩියා කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ජේ.ඒ.චන්ද්‍රකුමාර මැතිතුමා :-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** මොකක්ද මන්ත්‍රීතුමා. මුන්ට මේක දාලා නිදාගන්නද කියන්නේ මන්ත්‍රීතුමා වැඩ නොකර.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා :-** ඒකේ තියෙන එක අලුත්වැඩියා කරලා දෙන්න කියන්නේ. අලුතෙන් කරන්න කියනවා නෙමෙයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** දැනට කරන වැඩ ප්‍රමාණය තේරෙනවානේ. ඔබතුමා කියන්නේ තවත් මේක රත්වෙන වෙලාවේ ඒ.සී. කරලා දීලා පැත්තකට දාලා නිදාගන්න කියලද.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා :-** මම දවසක් ගියා සභාපතිතුමා.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා :-** ගරු සභාපතිතුමනි, කලින් යෝජනාවේ තියෙනවා කෘෘ කැබ් රථය වීථි පහන් නඩත්තු කටයුතු සඳහා සුදුසු පරිදි නවීකරණය කරන්න කියලා. ඊළඟ යෝජනාවේ දාලා තියෙනවා කෘෘ කැබ් රථයේ වායු සමීකරණ පද්ධතිය අලුත්වැඩියා කරලා දෙන්න කියලා. මේ යෝජනා දෙක බැලුවම තේරෙන්නේ වායු සමනය කරලා දෙන්නේ විථි පහන් නඩත්තු කටයුතු සඳහා යන්න කියලා.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා :-** කවුරුවත් අනුමත කරන්නේ නෑ ඕවා.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා :-** හා එහෙම නම් ඕක ඉවර කරන්න. අයින් කරලා දාන්නකෝ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** ඔබතුමා මොන අරමුණෙන්ද මේක යෝජනා කරේ.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා :-** සද්භාවයෙන් මම යෝජනා කරේ ඒ මිනිස්සුන්ට.

**ගරු මන්ත්‍රී ජේ.ඒ.චන්ද්‍රකුමාර මැතිතුමා :-** ඒ.සී. කරන එක හොඳයි. නිලධාරීන් වැඩිපුරම කෘෘ කැබ් එකේනේ යන්නේ.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා :-** මමත් ගියා ඒකේ. මටත් එපා වුණා. අනිත් මිනිස්සු සැප විඳිනවා නම් කම්කරුවන්ටත් සැප විදීමේ අයිතිය තියෙනවා. ඒ අයිතිය ඒ මිනිස්සුන්ටත් තියෙනවානේ. මේ අය මගේ බාප්පත් නෙමෙයි, පුංචි අම්මගේ පුතත් නෙමෙයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** සේවක අභිප්‍රේරණය සඳහා ඉදිරිපත් කරලා තියෙන්නේ.

**ගරු මන්ත්‍රී ජේ.ඒ.චන්ද්‍රකුමාර මැතිතුමා :-** දෙකම ඒ.සී. කරලා දෙන්න. ඒ මිනිස්සුන්ගේ අයිතියක්නේ ඒක.

**ගරු මන්ත්‍රී එම්.එන්.එච්. කියාස් මැතිතුමා :-** ලයිට් හදන කොට කැබ් එකේ නැගලා යනවා. ඒකේ ඒ.සී. නෑ.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා :-** මම එක දවසයිනේ යන්නේ.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා :-** මේ වගේ යෝජනාවල් සභාවට දාන්න කලින් න්‍යාය පත්‍රයෙන් ඉවත් කරන්න ඔබතුමාට බලය තියෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** බලය තියෙනවා. මේක ඉතිං සභාවට දාලා ඉවත් වෙන එක හොඳයිනේ. මම වැඩි ප්‍රජාතන්ත්‍රවාදි වුණා.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා :-** යෝජනා කරන්න මට අයිතිය තියෙනවා. මම අලුතෙන් දාන්න කිවුවේ නෑ. තියෙන එක ඒ මිනිස්සුන්ටත් හදලා දෙන්න කිවුවේ. අපි ඒ. සී. එකේ යනවා නම් ඒ මිනිස්සුන්ටත් ඒ. සී. එකේ යන්න හදලා දෙන්න කිවුවේ. එහෙම නම් අනිත් ඒවාටත් ඒ.සී. ඕන නැහැ.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා :-** සභාපතිතුමනි, තිස්ස මන්ත්‍රීතුමාගේ යෝජනාවත් එක්ක මම හිටගන්නවා. ලයිට් හදන එක විතරක් නෙමෙයි මේ වාහනයෙන් සිදු වන්නේ. මේ

වාහනයෙන් නොකෙරෙන දෙයක් මට කියන්න මේ සභාවේ. ඒ නිසා ඒ යෝජනාවත් එක්ක මම හිටගන්නවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** හරි හදන්න දාන්න ඒ.සී. එක.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** මම ගියා. මම යන්නේ එක දවසයිනේ. ඒ මිනිස්සු කණු උඩත් නැඟලා ඇවිල්ලා අරකේ යනවා. මට පෞද්ගලිකව සල්ලි තියෙනවා නම් මම හදලා දෙනවා. මට ගැටලුවක් නෑ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ- 25.** වී.සී පාර, දෙණියවත්තේ පදිංචි එන්.ඒ ආරියවතී මහත්මියගේ නිවස අසළ පැති කාණු පද්ධතියක් ඉදිකිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ජේ.ඒ.චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

<u>ගරු මන්ත්‍රීනි ඩී.ජී. වාසනා උදයංගනී මැතිණියගේ යෝජනා</u>

**ගරු මන්ත්‍රීනි ඩී.ජී. වාසනා උදයංගනී මැතිණිය ඃ- 26.** උළුවිටිකේ, ඉලේපෙරුම මාවතේ බුද්ධික මහතාගේ නිවස ඉදිරිපිටින් වැසි ජලය ගලා බැස යාම සඳහා නව කාණු පද්ධතියක් සකස් කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රීනි ඩී.ජී. වාසනා උදයංගනී මැතිණිය ඃ- 27.** නාවින්න, අඹගහදූව වත්ත මාර්ගයේ ඉතිරි කොටස සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රීනි ඩී.ජී. වාසනා උදයංගනී මැතිණිය ඃ- 28.** උළුවිටිකේ, සංඝරතන මාවතේ දමින්ද මහතාගේ නිවස අසල ඇති බෝක්කුව සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

<u>ගරු මන්ත්‍රීනි එම්. ගයාත්‍රි කාංචනා මැතිණියගේ යෝජනා</u>

**ගරු මන්ත්‍රීනි එම්. ගයාත්‍රි කාංචනා මැතිණිය ඃ- 29.** බාස්වත්ත ප්‍රජා ශාලාව අසල ප්‍රාදේශීය සභාව සතු ඉඩම බැකෝ යන්ත්‍රය යොදාගෙන ක්‍රීඩා පිටියක් ලෙස සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රීනි එම්. ගයාත්‍රි කාංචනා මැතිණිය ඃ-** බාස්වත්ත ප්‍රජා ශාලාව සභාව සතු ඉඩමක තියෙන්නේ. එතන ක්‍රීඩාපිටියක් සකස් කර දෙන මෙන් ඉල්ලීමක් කරලා තියෙනවා යෞවන සමාජයකින්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක සම්පූර්ණයෙන් පොදු ඉඩමක් නේද මන්ත්‍රීතුමිය.

**ගරු මන්ත්‍රීනි එම්. ගයාත්‍රි කාංචනා මැතිණිය ඃ-** එයාලා ඉල්ලන්නේ හවසට සෙල්ලම් කරන්න ප්‍රමාණයක්. වොලිබෝල් කෝඩ් එකක් හදාගන්න ප්‍රමාණයක් ඉල්ලන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රීනි පී. ටෙක්ලා ශ්‍යාමලී මැතිණිය ඃ-** ගරු සභාපතිතුමා යෝජනාවක් තියෙනවා, ස්වයංරැකියාලාභීන් ඉල්ලීමක් කරනවා ඔබතුමාගෙන්. ස්වයංරැකියා කරාට එයාලට බඩු විකුණ ගැනීමේ ප්‍රශ්නයක් තියෙනවා. ඒ නිසා සභාව හරහා හරි ඒ අයට වෙළඳපොළ සකස් කරලා දෙන්න.

පැච්වර්ක් බෑග් වගේ දේවල් ඒ අයට විකුණා ගැනීමේ අපහසුතාවයක් තියෙනවා. ඒ අයගේ හැකියාවෙන් කරන දෙයක් නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපිට මෙහෙම දෙයක් කරන්න පුළුවන් ටෙක්ලා මන්ත්‍රීතුමිය. සභාවේ ගැරිජ් එක තියෙනවානේ ඕන නම් ඉතිං පොළ දවසට අපිට ඒක ලේස්ති කරලා දෙන්න පුළුවන්. ප්‍රචාරක කටයුත්ත ඒ අය කර ගන්න ඕන.

**ගරු මන්ත්‍රීනි පී. ටෙක්ලා ශ්‍යාමලී මැතිණිය ඃ-** මට කියපු ස්වයංරැකියාලාභිනිය ඉන්නවානේ. එයා හරහා අපි ඒ අයට කැඳවීමක් කරමු. ඊට පස්සේ දිනයක් කියමු.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ප්‍රචාරක කටයුත්ත ඒ අය කරන්න ඕන. පොළට එන අය ඒ අය ගෙන්න ගන්න ඕන.

**ගරු මන්ත්‍රීනි පී. ටෙක්ලා ශ්‍යාමලී මැතිණිය ඃ-** ඒක ඒ අය සතුයි. ප්‍රචාරක කටයුත්ත අපිට කරන්න බෑනේ. තැන හදලා දෙන්න පුළුවන්.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** ඒ ව්‍යාපාරිකයන්ට පොළ තියෙන දවසට පොළ භූමියේ යම් කොටසක් වෙන් කරලා දෙන්න බැරිද.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** පොළ සම්පූර්ණයෙන්ම බදු දීලා නේ තියෙන්නේ. අපි නෙමෙයිනේ පාලනය කරන්නේ. අපිට මුදල් ආවට සම්පූර්ණයෙන්ම වෙන කෙනෙක්ට බදු දීලා නේ තියෙන්නේ.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** ඒ නිෂ්පාදන ගෙනල්ලා විකුණන්න වෙන්නේ පොළට එන ජනතාවටනේ. කවදාවත් ඒ ජනතාව සභාව ඇතුළට එන්නේ නෑ ඒකේ තියෙන දේවල් ගන්න. ඒක නිසා පොළ භූමියේම පටියකින් හරි වෙන් කරලා ඒ ව්‍යාපාරිකයන්ට හදලා දෙන්න පුළුවන් නම් තමයි වටින්නේ ඕක.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එතන ඉඩකඩ නැහැ.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** කොහොමවත් ඇතුළට එන්නේ නැහැ මිනිස්සු ඕවා ගන්න. ඒ යෝජනාව හොඳයි.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා, එතුමිය කරපු යෝජනාව හොඳයි. මමත් කාලයක් තිස්සේ හෙව්වා ඒ වගේ නිෂ්පාදන කණ්ඩායම් එක්ක සභාවක් මැදිහත් වෙලා දෙයක් කරන්න. අපේ මොල්ලිගොඩ වත්ත ප්‍රජා ශාලාවේ ඉඩකඩ තියෙනවා මේකට.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දැනට පුළුවන් අපිට අර වැට ගහලා තියෙන්නේ එතන. වැටයි තාප්පයයි අතර ටික.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** පෙර පාසල තියෙන අවස්ථාවේදී හානියක් වේවිද. පෙර පාසල නොමැති අවස්ථාවල දෙමු.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** පෙර පාසලට හානියක් වෙන්නේ නැහැ. වැටයි, තාප්පයයි අතර අඩි ගාණක් තියෙනවානේ. පෙර පාසල තිබුණත් හානියක් වෙන්නේ නැහැ. පෙර පාසලට සම්බන්ධ නැහැ. පෙර පාසල ඉස්සරහ වැටක් ගහලා තියෙනවානේ. මම කියන්නේ වැටයි, තාප්පයයි අතර ඉඩ ගැන.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** මම කියන්නෙත් ඒකයි. පෙර පාසල තිබුණත් කමක් නෑ. වැටයි තාප්පයයි අතර තියෙන ඉඩ ප්‍රමාණවත්.

**ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය ඃ-** ගරු සභාපතිතුමා මෙහෙමයි. මේක මේ අඩු ආදායම්ලාභීන් ස්වයංරැකියා කරන්නේ. ඒ නිසා පොළ දවසට ඕක අපි දැම්මට මිනිස්සු දැක්කත් අතේ සල්ලි නෑ ඕවා ගන්න. ඕක නිකං බොරුවක් වගේ මට හැගෙන දේ. ඇත්තටම ඕක සතියේ දවස් පහේ මෙතන තියන් හිටියට බෑග් එකක් දෙකක් සතියකට විකුණ ගන්න ඇහැකි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දවස් පහම දෙන්න බැහැ.

**ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය ඃ-** ඉරිදා, සෙනසුරාදා වගේ දවස් දෙකක් උදේ ඉඳන් හවස් වෙනකම් ඒ මිනිස්සුන්ට තියන් ඉන්න පුළුවන්ද. ඒ වගේ උදවුවක් කරාට මිනිස්සු අතේ සල්ලි අඩුයි බෑග් එකක් ගන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔතන ගැටලුව තියෙන්නේ අපිටත් මුකුත් කරන්න බැහැ.

**(ඊ) කාරක සභාවල වාර්තා**

**01. මුදල් සහ ප්‍රතිපත්ති සැකසුම් කමිටුව.**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ- I.** 2020.01.28 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති සැකසුම් කමිටු වාර්තාව.

**ගරු මන්ත්‍රී ජේ.ඒ.චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** එම වාර්තාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**02. තාක්ෂණික සේවා කමිටුව**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** I. 2020-02-05 දින පැවති තාක්ෂණික සේවා කමිටු වාර්තාව

**ගරු මන්ත්‍රී ජේ.ඒ.චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** එම වාර්තාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**03. නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටුව**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** I. 2020-02-05 දින පැවති නිවාස සහ ප්‍රජා සංවර්ධන කමිටු වාර්තාව

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** එම වාර්තාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**04. පරිසරය සහ පහසුකම් කමිටුව**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** I. 2020-02-05 දින පැවති පරිසරය සහ පහසුකම් කමිටු වාර්තාව

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** එම වාර්තාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**(උ) ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ, එකතු කල ආදායම් පිළිබඳ ප්‍රගති වාර්තා සහ ප්‍රාදේශීය සභාවට ඉදිරිපත් කිරීමට නියමිත වෙනත් ලේඛන ඉදිරිපත් කිරීම හා සලකා බැලීම ඃ-**

**01. ලැබීම් පිළිබඳ මාසික ප්‍රකාශ**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** 2020 වර්ෂයේ ජනවාරි මස මාසික ඒකාබද්ධ ලැබීම් සාරාංශය (ප්‍රා.ස. 16)

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** එම වාර්තාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**02. වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** 2020 වර්ෂයේ ජනවාරි මස මාසික ඒකාබද්ධ වැය සාරාංශය (ප්‍රා.ස.14)

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** එම වාර්තාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

<u>**03. එකතු කල ආදායම පිළිබඳ ප්‍රගති වාර්තාව**</u>

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** 2020 වර්ෂයේ ජනවාරි මස මාසික ඒකාබද්ධ හිඟ ආදායම් ප්‍රකාශය (ප්‍රා.ස. 07)

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** එම වාර්තාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම වාර්තාව ඒකමතිකව සහා සම්මත විය.

<u>**04. වෙනත් ලේඛන**</u> **ඃ-** නැත

<u>**(උ෴) රැස්වීම් කැඳවීම් දැන්වීමේ දක්වා ඇති වෙනත් කාරණා**</u>

<u>**පසුගිය මහා සභා රැස්වීම් සඳහා ඉදිරිපත් කරන ලද යෝජනාවල ප්‍රගතිය සමාලෝචනය**</u>

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** 2020 වර්ෂයේ පෙබරවාරි මස මහා සභාවට ඉදිරිපත් කරන ප්‍රගතිය

**ගරු මන්ත්‍රිනි එම්. ගයාත්‍රි කාංචනා මැතිණිය ඃ-** ගරු සභාපතිතුමනි, මේක මම අවස්ථාවක් කර ගන්නවා උප සභාපතිතුමා වෙනුවෙන් ස්තුති කරන්න. අද මම හිතන්නේ උප සභාපතිතුමාගේ කොට්ඨාශයේ, ගමේ අයගේ, ව්‍යාපාරික ප්‍රජාවගේ එකතුවෙන් අසරණ පවුලකට නිවසක් හදලා දීලා අද ඒ අය පදිංචි වුණා. මම හිතන්නේ අපි මන්ත්‍රී මණ්ඩලය වෙනුවෙන් එතුමාට ස්තුතිවන්ත වෙන්න ඕන ඒ කර්තව්‍ය වෙනුවෙන්.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, අපි මේ සාකච්ඡාවෙන් පස්සේ මේ දින කීපය ඇතුළත, මේ මාසය ඇතුළත ප්‍රගතිය පිළිබඳ වාර්තාවක් නිලධාරීන්ට අපිට ලබා දෙන්න කියන්න.

ඔබතුමා එදා විශේෂ සභාවේදී කමිටුවක් විදියට පත්කරා. අනවසර ඉදිකිරීම්, වෙන්දේසි ඉඩම්, අනතුරුදායක ගස් පිළිබඳව. මම ඉල්ලා සිටිනවා ගරු සභාපතිතුමනි ඒ නියෝජිත මන්ත්‍රීවරු ටිකට කවදද පුළුවන් දිනය. දැනට මම ටිකක් එකතු කරලා වාර්තාවක් හදලා තියෙනවා. මේවායේ නිවැරදිතාවය පිළිබඳ මෙහේ තියෙන ලිපි ලේඛන එක්ක බලන්න ඕන. කවදද ඒකට දිනය දාගන්නේ. ඉන්දික මන්ත්‍රීතුමා කවදද පුළුවන් දිනය.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** විසි වෙනිදා දාගමු අර වැඩේ ඉවර වෙලා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, විසිවෙනිදා තියෙනවා ප්ලයිවුඩ් එකේ පළමු මාධ්‍ය හමුව. ඒක පෙ.ව 09.00ට තියෙන්නේ. ඒකට සියලුම දෙනාට එන්න බැරි වුණත් කීප දෙනෙක් හරි එමු.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කවදද දා ගන්නේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** විසිවෙනිදා පළමු මාධ්‍ය සාකච්ඡාව ඉවර වෙලා කරමු. ඔබතුමා කරුණාකරලා ලිපියක් නිකුත් කරන්න එතකොට මේ අයට රාජකාරී නිවාඩු ලබා ගැනීමේ හැකියාවක් තියෙනවා.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** මෙතුමා වෙන්දේසි ඉඩම් පිළිබඳව දිනපතා ලොකු සටනක් කරනවා. එහේ යම්කිසි ප්‍රතිඵලයක් විදියට තමයි සභාපතිතුමා මේ කමිටුව පත්කරන්නේ. එතුමා ගෞරවයක් වශයෙන් මේ කමිටුව අබේසේකර කමිටුව කියලා නම් කරමු.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මේ වැඩේ විහිළුවට ගන්න එපා. දැන් වෙනකොට මම එකතු කරපු දේවල් තියෙනවා.

මම මේ අවස්ථාවේදී ඉල්ලා සිටිනවා කාරක සභා අවස්ථාවක් කරලා පසුගිය සභාවේදීත්, විශේෂ සභාවේදීත්, මීට ඉස්සර සභාවලත් අනවසර ඉදිකිරීම්, ගොඩකිරීම්, වෙන්දේසි ඉඩම් පිළිබඳව කතා කරා. ඒ පිළිබඳව අපේ තාක්ෂණ නිලධාරිතුමන්ලා ගනිපු ක්‍රියාමාර්ග අපිට ඉදිරිපත් කරන්න කියන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අවශ්‍ය වෙන්නේ නැනේ. අපි කමිටුවේදී කතා කරමු.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** දැනට මොකක්ද දන්නවාද, දැනට ප්‍රධාන අනවසර ඉදිකිරීම් තියෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** විසිවෙනිදා කියන්නේ අනිද්දානේ මන්ත්‍රීතුමා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** එදාට කමිටුවට තියෙන්නේ අපිට ගිහින් පොත්පත් බලලා ගන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කමිටුව කැඳවනවානේ. එතකොට නිලධාරීන් කියාවි.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** දැනට ගනිපු ක්‍රියාමාර්ග ගැන අපේ මන්ත්‍රීවරු දැන ගන්න එක හොඳයිනේ. වැඩි වෙලාවක් යන්නේ නැනේ සභාපතිතුමා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** නිලධාරීන් නැනේ. ගුණසේකර මහත්තයත් නැනේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** සභාව වෙලාවට ගරු සභාපතිතුමා නිලධාරීන්ට ඉන්න කියන්න මොන වැඩේ තිබුණත්. අද සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි මධ්‍යස්ථානයත් එක්ක එකතු වෙලා ඩෙංගු මර්ධන වැඩසටහනකට යනවා. හදිසියේ ආපු වැඩසටහනක් ඒක.

**ගරු මන්ත්‍රී ජේ.ඒ.චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, ප්‍රගතියට අදාළ කාරණයක් කියලා ඉදිරිපත් කරන්න යන කාරණාව විශ්වාස කරනවා. පසුගිය මාසයේ අවසාන දිනයේදී වගේ මට මතක විදියට ජල සම්පාදන රාජ්‍ය අමාත්‍ය වාසුදේව නානායක්කාර ඇමතිතුමා ගාල්ල ප්‍රධාන ලේකම් කාර්යාලයට පැමිණුනා. ඒ බව දැන ගෙන සභාපතිතුමාගේ උපදෙස් පරිදි එතුමාත්, මමත් සාකච්ඡා කරලා අපි සභාපතිතුමා ඇතුළු බෝපෙ පෝද්දල මන්ත්‍රී මණ්ඩලය කියලා එතුමාගෙන් මේ ජල ප්‍රශ්නය ගැන විසඳුමක් බලාපොරොත්තුවෙන් ඉල්ලීමක් ඉදිරිපත් කරා. ඒ පිළිබඳව අත්සන් එකතුවක් වුණේ නෑ. ඒ වගේම අවශ්‍යතාවයකුත් පැන නැගුණේ නෑ. නමුත් අපේ යුතුකමක් තියෙනවා මේ කාරණය ගැන තමුන්නාන්සේලාව දැනුවත් කරන එක. එහෙම නම් මෙහෙමයි අපි මේ ලියුම යොමු කරේ අපේ ලෙටර් හෙඩ්න් එක යටතේ.

- මේ සම්බන්ධව ජල සම්පාදන රාජ්‍ය අමාත්‍ය, ගරු වාසුදේව නානායක්කාර මැතිතුමා වෙත යොමු කරන ලද ලිපිය සභාගත කරන ලදී.

මෙම ලිපිය සභාපතිතුමා විසින් ඇමතිතුමාට යොමු කරත් එතනදී ඇතිවුණ තත්ත්වය පිළිබඳව විස්තර කරන්න කියලා මම ඉල්ලා සිටිනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මේ අවුරුද්ද අවසන් වන විට ඝණ අඩි 5000 ක ධාරිතාවයක් එකතු වෙනවා. ලබන වසරේදී නැවත 5000 ක් ඒ ආකාරයෙන් කෝටි 1200 ක මුදලක් අවශ්‍ය වෙනවා මේ කටයුත්ත සම්පූර්ණයෙන් නිම කරන්න. ඒක අදියර වශයෙන් අවුරුදු තුනක් ඇතුළත ඉටු කරන්න කියන පොරොන්දුවක් තමයි තියෙන්නේ. මේ වර්ෂය අවසන් වන විට ඝණ අඩි 5000 ක් එකතු වෙනවා. තව පැය දෙකක් කොහොමහරි එහෙට මෙහෙට කරලා දෙන්නම් කියලා කිව්වා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ගරු සභපතිතුමා, ඔය තත්ත්වයම තමයි දැන් පහුගිය ආණ්ඩුව කාලේ කිව්වේ. ඔය දේම, ඔය පොරොන්දුවම තමයි කිව්වේ. දැන් ඒක වැඩි කර ගෙන යන්න කටයුතු කරගෙන ගියා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** නෑ අබේසේකර මන්ත්‍රීතුමා. ඒකෙදි වෙනත් කාරණයක් සිද්ධ වුණා. මහා ගාල්ල ජල යෝජනා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරේ රිචඩ් පතිරණ ඇමතිතුමා. ඒක පටන් ගත්තේ අක්මීමන ආසනය ප්‍රමුඛව. අක්මීමන ආසනය සම්පූර්ණයෙන්ම ආවරණය වෙන්නයි රත්ගම ආසනයෙත්, හබරාදුව ආසනයේත් බොහොම සුළු කොටසකටයි. ඔය ආකාරයෙන් තමයි සිදු වුණේ. නමුත් අබේසේකර මන්ත්‍රීතුමා ගිය ආණ්ඩුව ආපු ගමන් මේකේ නල ජල මාර්ග දිගු කරා. දිගු කරේ තියෙන ප්‍රභවයන්ගෙන්. අලුත් ප්‍රභවයක් ඇතිකරේ නැහැ. එතනයි මේකේ අඩුපාඩුව වුණේ. ඒක තමයි ගිය ආණ්ඩුවෙන් කරපු වැරැද්ද. ඔබතුමාලගේ යහපාලන ආණ්ඩුවෙන් කරේ.

**ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා ඃ-** ගිය ආණ්ඩුවෙන් නෙමෙයි ඊට ඉස්සෙල්ලා ආණ්ඩුවෙන්.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඩඩ්ලි මන්ත්‍රීතුමා ඒක පැහැදිලි කරන්න.

**ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා ඃ-** දිගු කරේ චන්දිම වීරක්කෝඩි මහත්තයා. ඒ ආණ්ඩුවේ ඇමති වුණාම, ඔයගොල්ලන්ගේ ආණ්ඩුවේ ඇමති වුණාම දිගු කරේ. ඇමතිකමත් තිබුණේ නෑ කළින්.

ඔබතුමාලගේ ආණ්ඩුවෙන් තමයි ඇමතිකමක් හම්බ වුණේ. කොහොමහරි මහින්ද රාජපක්ෂ මහත්තයාගේ කාලේ ආණ්ඩුව ඉවර වෙනකම් වතුර දුන්නනේ. පැය 24 ම දුන්නනේ.

**ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, මෙහෙමයි වුණේ. දැන් හබරාදූව ප්‍රදේශයේ යම් යම් තැන්වල දිගු කරගෙන ගියා. ඊට පස්සේ වැලිගම වටරවුම තියෙන තැන මෙහා පැත්තේ හැදුවා මහා හෝටලයක්. තට්ටු 06 ක් ඒක. මේ හෝටලයට වතුර නැති වුණා. මේක වුණේ ගිය ආණ්ඩුවට ඉස්සෙල්ලා ආණ්ඩුව තියෙන කාලේ. ඒක හදපු පුද්ගලයෝ කවුද කියලා මම කියන්න යන්නේ නැහැ. ඊට පස්සේ මෙතනට වතුර අවශ්‍යතාවයක් වෙලා, ගොවියාපාන පාලම ගාවින් මෙහා පැත්තෙන් කපල් කරා වැලිගමට. කපල් කරලා වැලිගමට වෙනකම් වතුර ගත්තා. වැලිගමටත් වතුර දුන්නේ හපුගල ටැංකියෙන්. එහෙම තිබුණා. ඊට පස්සේ ආණ්ඩු මාරු වුණ ගමන් ඒ වැල් එක වැහුවා. එතනින් නතර කරා. අහංගම වැඩ බිම බෝහල් පම්ප් දාලා දිවුවේ. අහංගම බෝහල් පම්ප් සවුත්තු වුණා. සවුත්තු වෙන කොට ගාල්ලේ ආදායම වැඩියි. දකුණු පළාතේ වැඩිම ආදායම තිබුණේ ගාල්ලේ. ඊට පස්සේ මෙයාලා කරේ බෝහල් පම්ප් ටික වහලා දාලා මේ ලයින් එක කපල් කරා අහංගමට. දැන් අහංගමට වතුර යන්නෙත් මේකෙන්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කොයි කාලෙද ඒක කරේ.

**ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා ඃ-** එහෙම හරියට මට කාලය මතක නෑ. එහෙම කරගෙන ආවා ලාභ ලබන්න කියලා. මට ඒ කරපු ආණ්ඩු, පක්ෂ මොනවද කියලා මතක නෑ. ආණ්ඩුව ගැන තැකීමක් නැහැ. මණ්ඩලය බලන්නේ ලාභ ගන්නනේ. මණ්ඩලය ලාභය හා අපහසුතාවයට පත් වීම වළක්වා ගන්න තමයි එහෙම කරේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒකෙන් මන්ත්‍රීතුමා අපහසුතාවයට පත් වුණේ මේ සියලු මිනිස්සුනේ. අහංගම මිනිස්සුත් අපහසුතාවයට පත් කරා. මෙතෙක් පැය 24 වතුර දීපු මිනිස්සුන්ට අද පැය 05 ක් වතුර නැහැ. කඳු වල මිනිස්සුන්ට පැය 05 ක් වතුර නෑ. රෑ 02 ට වතුර එන්නේ. උදේ 06 ට කපනවා.

**ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා ඃ-** තාම මම මේක කියලා ඉවර නැහැ. ඊට පස්සේ අහංගමටත් දුන්නා. ගාල්ලට ලාභයි කියලා කරගෙන ගියා මණ්ඩලයෙන්. එහෙම කරගෙන යනකොට වතුර අර්බුදයක් ආවා. බෝපෙ පෝද්දලට වතුර නෑ. කොහොමද බෝපෙ පෝද්දල වතුර ප්‍රමාණය වැඩි කරන්න කියන ප්‍රශ්නය ආවා. මෙතනින් තමයි මහගොඩට වතුර ගැහුවේ. කියුබික් මීටර් 7000 දැන් 5000 යි කියන්නේ. 7000 ක් වැඩි කරා මම ඉන්න කාලේ මණ්ඩලයෙන්. මේ සභාවේ ඉන්න කාලෙම මම කිවුවනේ වැඩි කරා කියලා. මහගොඩට 7000 ක් ගැහුවා ගාල්ල යෝජනා ක්‍රමයෙන් වතුර. ඒ පාර අපිම යෝජනා කරලා ගාල්ලෙන් වතුර මහගොඩට යවමු කියලා ප්‍රොජෙක්ට් එකක් හැදුවා. අතන ඉස්කෝලේ ගාව පාර කඩලා ගැහුවා මහගොඩට ලයින් එක ගාල්ලෙන්. ගහලා මහගොඩට වතුර දුන්නා ගාල්ලෙන්. දුන්නම මෙහෙට වතුර වැඩි වෙන්න එපැයි. නමුත් ඒ වැඩි වුණෙත් නෑ. ඒ වැඩි වුණේ නැත්තේ මේක නිසා. ගාල්ලෙන් වතුර දෙන්නේ ගාල්ලට වතුර වැඩි වුණොත් විතරයි. නැත්නම් මෙහෙට වතුර දෙන්නේ නැහැ. මෙහේ ඉතුරු කරන්න ගිහිල්ලා 7000 ක් ගාල්ලෙන් ගහනවා කියලා අරහෙට අන්තිමට මෙහෙන්ම ගහනවා එහේට. ගාල්ලට යනවා වතුර. ගාල්ලට ගන්නේ අපේ වතුර නම් නෙමෙයි. ගාල්ල ස්කීම් එකේ වතුර පටලවා ගන්න එපා. මහා ගාල්ල ජල යෝජනා ක්‍රමය කියන්නේ එකක්. ගාල්ල ජල සම්පාදනය කියන්නේ තව එකක්. වක්වැල්ලේ තියෙන ට්‍රීට්මන්ට් ප්ලාන්ට් එක ගාල්ලේ. ගාල්ලෙ එක තමයි මහගොඩට සම්බන්ධ කරේ. මහා ගාල්ල යෝජනා ක්‍රමයෙන් තමයි අහංගමට වෙනකම් යන්නේ. මේ දෙකක්. ඒක නිසා මොකක්වත්ම නැති වෙලාවේ 5000 ක් තියෙන එක හොඳයි. නමුත් 5000 කින් නම් ඔය ප්‍රශ්නයෙන් බේරෙන්න බැහැ.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** 2015 ජනවාරි 08 වෙනිදා වෙනකම් අඛණ්ඩව වතුර ලබා දුන්නා. ඊට පස්සේ තමයි මේ ගැටළු ඇති වුණේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඒක නිසා තමයි ගරු සභාපතිතුමා අපි යෝජනා කරේ. ඒකයි මම මේ ප්‍රශ්නය කියන්න කියලත් කිවුවේ. අපි ඒකට කරා. අපිට අරහේ නැද්ද මෙහේ නැද්ද නෙමෙයි වැදගත්. අපි ඉන්න ප්‍රදේශය දරුණු ප්‍රශ්නයක් තියෙන්නේ. ඒ නිසා ඔබතුමන්ලා එක පාරක් ගිහින් සාකච්ඡා කරා. ඊළඟ පාර අපි ලැගලා හරි අපි ඒකට ක්‍රියාමාර්ගයක් ගමු. ඒකට මේ අවුරුද්ද අන්තිම වෙනකම් ඉන්නවා කියන එක නෙමෙයි වැදගත්.

**ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, ඔබතුමා යම් අවස්ථාවක් ආවොත් යෝජනා කරන්න. යුද්ධය අවසන් වුණාට පස්සේ අනාථ කඳවුරු හැදුවා මැණික් ෆාම් එකේ. මැණික් ෆාම් අනාථ කඳවුර කරපු වෙලාවේ ප්‍රෙෂර් ෆිල්ටර් කියලා ජාතියක් ගැහුවා. ඒක රත්මලානේ ජල සම්පාදන මණ්ඩලයෙන් කරේ. එයාලා ගිහිල්ලා ඒවා හයි කරා. ඒවා තාවකාලිකව කරන්න පුළුවන් වැඩ. මම යූනියන් එක විදියට දිගටම යෝජනා කරා ප්‍රෙෂර් ෆිල්ටර් එකක් ගෙනල්ලා වක්වැල්ලේ හයි කරලා වතුර මට්ටම වැඩි කරන්න කියලා. කරගන්න බැරි වුණා. ඔබතුමා කියන්න. මැණික් ෆාම් එකට ජලය ලබා දීපු ක්‍රමවේදය පාවිච්චි කරලා දැනට මේ තියෙන අර්බුදයට විසඳුමක් දෙන්න කියලා මණ්ඩලයට යෝජනා කරන්න.

**ගරු මන්ත්‍රී ජේ.ඒ.චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** ඒකට කීයක් විතර වියදම යනවද?.

**ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා ඃ-** ඒ වියදම ජල සම්පාදන මණ්ඩලයෙන් දරන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඉන්දික මන්ත්‍රීතුමාට අවස්ථාව ලබා දෙනවා. එතුමා අවස්ථාවක් ඉල්ලා හිටියා අධිරාජ්‍යවාදී කුමන්ත්‍රණයක් ගැන සඳහන් කරන්න.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** මේක හැල්ලුවට ලක් කරන්න එපා ගරු සභාපතිතුමනි. රටක් හැටියට ස්වෛරී රාජ්‍යයක් හැටියට අපි රටක් වශයෙන් ගත යුතු ක්‍රියාමාර්ග වලදී අපේ රටේ ස්වෛරීභාවය, අනාගතය සම්බන්ධ තීරණ වලට රටක් හැටියට ගත්තම අපිට තියෙන අභියෝග පිළිබඳව සැලකිලිමත් විය යුතුයි. අපිට ඉස්සරහදී සිදුවන කාරණා සම්බන්ධයෙන් බරපතල තත්ත්වයක් නිර්මාණය වෙමින් තියෙනවා. ඒ හේතුව රාජ්‍යයක් හැටියටත් හඳුනාගෙන තියෙනවා මේ මොහොත වන විට. පළවෙනි කාරණය විදියට මම කියන්න උත්සාහ දරන්නේ අද වෙන කොට මේ පහුගිය ජනවාරි මාසයෙන් පස්සේ අධිරාජ්‍යවාදී බලපෑම මත, එළඹෙන මානව හිමිකම් කොමිෂම ඉලක්ක කර ගෙන ඇමෙරිකා එක්සත් ජනපදය විසින් මේ වෙන කොට අපේ රටේ හමුදාපතිවරයාට විරුද්ධව බරපතල තීන්දුවක් අරගෙන තියෙනවා. එතුමා හා පවුලේ උදවියට එරෙහිව තහනම් නියෝගයක් පනවලා තියෙනවා රටට ඇතුළුවීම තහනම් කරලා ඇමෙරිකාවෙන්. අපිට රටක් හැටියට මේක බරපතල කාරණාවක්. ඒ නිසා අපේ රටට, ස්වෛරී රාජ්‍යයට, පුරවැසියන් හැටියට බෝපෙ පෝද්දල ජීවත්වෙන සියලු ජනතාව නියෝජනය කරමින් මේ සභාව හැටියට අපේ යුතුකමක් විදියට ඇමෙරිකාවට විරුද්ධව ඒ ක්‍රියාමාර්ගය හකුලා ගන්න බලකරන්න ඕන. අපේ ස්වෛරී රාජ්‍යයක නිදහස, අභිමානය, භෞමික අඛණ්ඩතාවය සම්බන්ධයෙන් රටක් හැටියට, රාජ්‍යයක් හැටියට අපිට ගන්න පුළුවන් තීන්දු වලට අනවශ්‍ය අතපෙවීම් වැළැක්වීමට යෝජනාවක් සම්මත කර ගන්න කියලා යෝජනා කරනවා. මේ මොහොතේ රජය, විදේශ කටයුතු අමාත්‍යාංශය ඇමෙරිකානු තානාපතිනිය කැඳවලා ඒ සම්බන්ධව ප්‍රකාශ කරලා තියෙනවා. හොඳ ප්‍රවේශයක් ඒක.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** වෙන කිසිම නායකයෙක් නොකරපු දෙයක්. මොකද ඇමරිකාව ඒ තීන්දුව ගත්තම විදේශ කටයුතු ඇමතිවරයා විදියට එතුමා තානාපතිතුමිය කැඳවලා දැඩි සේ චෝදනා එල්ල කරා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** අපේ සභාව හැටියට අපිටත්, ඒ සම්බන්ධව අවබෝධයක්, වගකීමක් තියෙන්න ඕන. ඒ නිසා අපි මේක තේරුම් ගත යුතුයි. ඇමරිකාව කාගේ වුවමනාවකට, මොන අරමුණකට මේක ක්‍රියාත්මක කරන්නේ කියලා හොයන්න ඕන. එතකොට තමයි අපිට පුළුවන් වෙන්නේ රටක් හැටියට මීට එරෙහිව ක්‍රියාමාර්ග තෝරන කොට ඒ ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් අපේ පැත්තෙන් දෙන්න පුළුවන් දායකත්වය දෙන්න. ඒ නිසා ඇමෙරිකාව මෙතෙක් ඉතිහාසයේ අපිට එරෙහිව, හමුදාපතිවරයාට එරෙහිව වැඩ කරලා තියෙනවා. හමුදාපතිවරයා නියෝජනය කරන්නේ රට. ලංකාවේ ආරක්ෂක අංශ. ඊට එරෙහිව ගන්න ක්‍රියාමාර්ග රටකට එරෙහිව ගන්න ක්‍රියාමාර්ගයක්. ඒ නිසා ඇමෙරිකාව පහුගිය කාලයේ ක්‍රියාත්මක වෙච්ච ආකාරය විශේෂයෙන්ම ගත්තොත් ඉරාකයේදී, ඇෆ්ගන්ස්ථානයේදී එවැනි මානව හිමිකම් කඩකරපු ඉතිහාසයක් තියෙන රාජ්‍යයක් අපිට එරෙහි වෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒකේ හොඳම කාරණය තමයි මන්ත්‍රීතුමා, දැන් ශවේන්ද්‍ර සිල්වා මැතිතුමා ඇමෙරිකාවේ තානාපති වෙලා ඉන්නවා කාලයක්. එතකොට මේ කිසිම බාධකයක් නැහැ. ඒ වගේම යුධ හමුදාපති විදියට පත්කරන්නේ මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා. නමුත් එතන ඉඳන් මේ දක්වා කිසිම බාධාවක් නෑ. නමුත් වර්තමානයේ ජනාධිපතිවරයා ආරක්ෂක මණ්ඩල ප්‍රධානියා විදියට පත්කරාට පස්සේ තමයි මේ සියලු ගැටළු මතු වන්නේ. හොඳට පැහැදිලියි ඇමෙරිකාවත් එක්ක ගණුදෙනු කරන නායකයොන්ට විතරයි මෙහෙම දෙයක් කරන්න පුළුවන්.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** මේකේ ඉලක්කය පැහැදිලියි. මේකේ ඉලක්කය එළඹෙන ජිනිවා මානව හිමිකම් සැසිවාරයට කලින් රටක් හැටියට හිරකරන්න වුවමනාව තියෙන්නේ. ඇමෙරිකාව මේ ක්‍රියාමාර්ගයම ගන්න කොට ඉරානයට එරෙහිව ජාත්‍යන්තර ගුවන්තොටුපලේදී හෂේන් සුලෙයිමානිව ඝාතනය කරනවා බෝම්බ ගහලා. එතකොට එහෙම ඝාතනයන් කරපු රටක් අනෙකුත් රාජ්‍යයන්ට මැදිහත්වීම් කරලා මානව හිමිකම් කඩකරා කියලා තමන්ට චෝදනා එල්ල නොවන රාජ්‍යයක් අපිට බලපෑම් කරනවා. අපේ රටට බලපෑම් කරනවා. ඒ නිසා මම කියන්නේ අපි ඉතාම දැඩිව ඉල්ලා සිටිනවා මේ සභාවෙන් මේ වගේ කුමන්ත්‍රණ පරාජය කළ යුතුයි. රටක් හැටියට ස්වාධීන රාජ්‍යයක් අපි. අපි ස්වෛරී රාජ්‍යයක්. අපේ අභිමානය, ගෞරවය අපේ අයිතිවාසිකමක්. ඒක අපේ වගකීමක්. ඒ වගකීම වෙනුවෙන් මේ ගනිපු ක්‍රියාමාර්ගයට එරෙහිව මම ගරු සභාවට යෝජනා කරනවා අපේ විරෝධතාවය ප්‍රකාශ කරන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**<u>සභා රැස්වීමේ වැඩ කටයුතු අවසන් කිරීම.</u>**

මීළඟ මහා සභා රැස්වීම 2020.03.17 වන අඟහරුවාදා දින පෙ.ව 09.30ට බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේ පැවැත්වෙන බව දන්වා සිටිමින් මහා සභා රැස්වීම අවසන් කරන ලදී.

දිල්රුක් එන්. අබේකෝන්,
සභාපති,
බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාව.